වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report 2025

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு

Ministry of Trade, Commerce, Food Security and Co-operative Development

වාර්ෂික කාර්යසාධන වාර්තාව-2025

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

අංක 492, ආර්.ඒ.ද මැල් මාවත

කොළඹ-03

පටුන

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය ... 1

1.1 හැඳින්වීම ... 1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ... 1
1.3 කාර්යයන් ... 3
1.4 සංවිධාන සටහන ... 5
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු ... 6
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අරමුදල් ... 6
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ... 6

2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ... 7

2.1 2025.01.01 දින සිට 2025.12.31 දක්වා ප්‍රගතිය ... 7
2.2 විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි සැලසුම් ... 19

3 පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 23

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය ... 23
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ... 25
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ... 27
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ... 29
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය ... 30
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය ... 30
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ... 30
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය ... 30
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව ... 31

4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක ... 46

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැළැස්ම මත පදනම්ව) ... 46

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය ... 47

5.1 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය ... 47
5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ... 49

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ... 50

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ... 50
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය ... 50
6.3 මානව සම්පත් සංවර්ධනය ... 51

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ... 53

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය 2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ස්ථාපිත කර ඇත.

පාරිභෝගිකයින්ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරඟකාරී දේශීය වෙළෙඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම, වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් කටයුතු කිරීම, ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම සහ එම වෙළෙඳ ප්‍රතිපත්තිය නියාමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මඟින් මහා ජනතාවගේ එදිනෙදා පරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ජීවන තත්ත්වය ඉහළ මට්ටමකින් පවත්වාගෙනයාම සඳහා මෙම අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ. තවද, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන සම්බන්ධීකරණය කිරීම මෙන්ම එසේම ආනයන හා අපනයන කටයුතු නියාමනය සඳහා දායකත්වය සැපයීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳාම ඉහළ නැංවීමටත්, විදේශ විනිමය උත්පාදනයටත්, ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරනු ලැබේ. දේශීය නිෂ්පාදනය වැඩි කරමින් භාණ්ඩ ආනයන වියදම අඩු කර සාධාරණ මිලකට පාරිභෝගිකයාට භාණ්ඩ සැපයීම සඳහා නිෂ්පාදන සමුපකාර සමිති ජාලය පුළුල් කිරීම සඳහා කටයුතු සිදු කිරීමද කරනු ලැබේ පාරිභෝගික අයිතීන් සුරැකීම, ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම, උසස් අධ්‍යාපනය සඳහා අඩු අදායම්ලාභී පවුල් වල දරුවන්ට මුල්‍යාධාර ලබාදීම, භාණ්ඩ හා සේවා ප්‍රමිතීන් සුරැකීම හා නිවැරදි කිරුම් මිනුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපාර හා වෙනත් ආයතන ලියාපදිංචි කිරීම, ආදී කාර්යයන් ද සිදු කරනු ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා සැපයීමේ හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙඳුන් හා වෙනත් සේවා සපයන්නන්ගේ සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා වෙළෙඳ අයිතීන් තහවුරු කරන දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ සබඳතා වැඩිකර ගැනීමට ද්විපාර්ශ්වීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් සඳහා එළඹීම තුළින් නව වෙළෙඳපළ අවස්ථා හිමි කරගැනීමටත්, ශ්‍රී ලාංකිකයින්ගේ එදිනෙදා පාරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ඉහළ ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමටත් දායක වීම.

අරමුණු

i. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිශ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිශ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිශ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම.

ii. වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.

iii. විවෘත තරගකාරී වෙළෙඳපොළ පරිසරයක ලංකා සතොස සමාගම, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික මට්ටමින් සමුපකාර සමිති හා සංගම් වැනි රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කිරීම.

iv. වෙළෙඳ ප්‍රජාව මෙන්ම පාරිභෝගිකයින්ගේද ප්‍රයෝජනය පිණිස මිණුම් ඒකක ප්‍රමිතින් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික වීම.

v. ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

vi. පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට අදාළ නෛතික කටයුතු සඳහා පාරිභෝගික සේවා අධිකාරියට අවශ්‍ය මඟපෙන්වීම.

vii. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.

viii. දේශීය නිශ්පාදනයන් හා අපනයන භාණ්ඩවල, නිසි ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාළ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වීම.

ix. උසස් අධ්‍යාපනය සඳහා දරු දැරියන් දිරිමත් කිරීමට අදාළ සුභසාධන ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට දායකත්වය ලබාදීම.

x. ජාතික බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම.

xi. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යනු ලබන අනුකූලතා තක්සේරු ප්‍රතීතන සේවා සහතික කිරීමට අදාළ මඟපෙන්වීම.

xii. ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳපළ අවස්ථා සඳහා අපනයනකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය ආයතනික පසුබිම සකස්කරදීම හා ඒ හා සම්බන්ධිත ආයතන දිරිගැන්වීම.

xiii. අදාළ ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වශයෙන් රටවල් සමඟ ගිවිසුම්ගතවීම් වලදී පහසුකම් සැළසීම හා සම්බන්ධීකරණය.

xiv. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පාද ක්‍රමය (GSP) අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් (NMTR), නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් (RTA) සඳහා අදාළ නෛතිකමය සම්බන්ධීකරණයට අවශ්‍ය මඟපෙන්වීම.

1.3 කාර්යයන්

i. අමාත්‍යාංශය රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන විෂයයන්ට සහ අමාත්‍යාංශයට අදාළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

ii. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම මෙන්ම නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ක්‍රියාවට නැංවීම.

iii. දේශීය ගොවි නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම.

iv. ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා පවත්වා ගෙන යාම සහ පවතින වෙළෙඳ ගිවිසුම් සමාලෝචනය කිරීම, අපනයන විවිධාංගිකරණය හරහා විදේශීය වෙළෙඳ පංගුව ඉහළ නංවා ගැනීම පිණිස නව ගිවිසුම් වලට එළැඹීම.

v. ප්‍රපාතන විරෝධී නීති ශක්තිමත් කිරීම, සාධාරණ වෙළෙඳ නීති හඳුන්වා දීම, හා පවතින රෙගුලාසි යාවත්කාලීන කිරීම.

vi. අගය එකතුකළ ප්‍රති - අපනයන සහ අන්තරාල (එන්ට්‍රෙපොට්) වෙළෙඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැපයීම.

vii. වෙළෙඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය සංවිධානය කිරීම.

viii. පාරිභෝගිකයාගේ අයිතීන් සුරැකීම සහ අභ්‍යන්තර වෙළෙඳාම විධිමත් කිරීම සඳහා පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා වෙළෙඳපොළ තරඟකාරිත්වය ඇති කිරීම, වෙළෙඳපොළ අධීක්ෂණය, වැටලීම් කිරීම හා වෙළඳුන් හා පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

ix. දේශීය වෙළෙඳපළ තුළ ඇතිවන මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම.

x. ලෝක වෙළෙඳපොළ තුළ නව අපනයන අවස්ථා හඳුනාගැනීමට මෙන්ම නව ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා පිළිබඳ ගවේශණය කිරීමට ආයතන දිරිමත් කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

xi. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම හා ආර්ථික තිරසාරත්වය ප්‍රවර්ධනය කරන බුද්ධිමය දේපළ පද්ධතියක් ස්ථාපිත කිරීම.

xii. සමාගම්, ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබාදීම හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීම.

xiii. දේශීය නිශ්පාදන වැඩි කිරීමෙන් ආනයන සීමා කර අඩු මිලට පාරිභෝගිකයාට භාණ්ඩ සැපයීම සඳහා නිෂ්පාදන සමුපකාර සමිති ජාලය පුළුල් කිරීම සඳහා අදාළ කටයුතු සිදු කිරීම.

xiv. ඉලක්කගත ප්‍රතිලාභීන්ට (ගැබිනි/කිරි දෙන මව්වරුන්ට සහ මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ට) ප්‍රශස්ත පෝෂ්‍ය පදාර්ථ සමඟ ත්‍රිපෝෂ ලබා දීම සහ, සවිබල ගන්වන ලද අතිරේක ආහාර නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දීම.

1.4 සංවිධාන සටහන



සංවිධාන ව්‍යුහය - වෙළෙඳ, වාණිජ,ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අමාත්‍යාංශ ලේකම්
අතිරේක ලේකම් (පාලන) ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ)
අතිරේක ලේකම් (ආයතන සම්බන්ධීකරණ) ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ)
අතිරේක ලේකම් (වෙළෙඳ හා පර්යේෂණ) ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ)
අතිරේක ලේකම් (සංවර්ධන) ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ)
අතිරේක ලේකම්* (ප්‍රතිපත්ති)Personal ශ්‍රී.ලං.කු.සේ. (විශේෂ)
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) ශ්‍රී.ලං.කු.සේ. (විශේෂ)
ප්‍රධාන මූල්‍ය නිලධාරී ශ්‍රී.ලං.ග.සේ. (විශේෂ)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ශ්‍රී.ලං.ප.සේ. I
අභ්‍යන්තර කටයුතු අංශය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ශ්‍රී.ලං.ප.සේ. I
ප්‍රසම්පාදන අංශය
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. III/II
ගණකාධිකාරී ශ්‍රී.ලං.ග.සේ. III/II
සහකාර ලේකම් ශ්‍රී.ලං.ප.සේ.III/II
සහකාර ලේකම් ශ්‍රී.ලං.ප.සේ. III/II
පරිපාලන නිලධාරී
නීති නිලධාරී
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. I
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ.III/II
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ.III/II
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. I
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. I
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කු.සේ. I
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කු.සේ. III/II
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. I
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. III/II
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කු.සේ. III/II
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කු.සේ. I
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කු.සේ. I
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කු.සේ. III/II
ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ලං.ග.සේ.I
ගණකාධිකාරී ශ්‍රී.ලං.ග.සේ.III/II
ප්‍රධාන අභ්‍යන්තර විගණක ශ්‍රී.ලං.ග.සේ.I
අභ්‍යන්තර විගණක ශ්‍රී.ලං.ග.සේ. III/II
ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම්
භාෂා පරිවර්තක 2
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී 2
සංඛ්‍යාලේඛන නිලධාරී
සංවර්ධන නිලධාරී 4
සංවර්ධන නිලධාරී 3
සංවර්ධන නිලධාරී 3
සංවර්ධන නිලධාරී 9
සංවර්ධන නිලධාරී 2
සංවර්ධන නිලධාරී 9
සංවර්ධන නිලධාරී 14
සංවර්ධන නිලධාරී 9
සංවර්ධන නිලධාරී 3
සංවර්ධන නිලධාරී 6
සංවර්ධන නිලධාරී 12
සංවර්ධන නිලධාරී 9
සංවර්ධන නිලධාරී 3
කළ. සේ.නිලධාරී 3
කළ. සේ.නිලධාරී 4
කළ. සේ.නිලධාරී 2
කළ. සේ.නිලධාරී 4
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහායක 3
කළ. සේ.නිලධාරී 2
කළ. සේ.නිලධාරී 5
කා.සේ.සේ. 1
රියදුරු 20
වීඩියෝ කැමරා ශිල්පී
නිශ්චල ඡායාරූප ශිල්පී
කැමරා සහායක
කා.සේ.සේ. 1
කා.සේ.සේ. 1
කා.සේ.සේ. 1
කා.සේ.සේ. 1
කා.සේ.සේ. 1
කා.සේ.සේ. 1
කා.සේ.සේ. 1
කා.සේ.සේ. 2
*තනතුරු අහිමි වූ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් සම්බන්ධව කටයුතු කිරීම යටතේ මෙම නිලධාරීන්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇත.
නිලධාරීන් සිටින තනතුරු (මාණ්ඩලික)
පුරප්පාඩු තනතුරු
නව තනතුරු

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටු කරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු පහකි.

අනු අංකය	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු	ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්
1	ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව	ආහාර සැපයුම් පනත (1942 අංක 42)
2	මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව	මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත (1995 අංක 35)
3	වාණිජ දෙපාර්තමේන්තුව	ප්‍රපතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත (2018 අංක 2)
4	සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව	සමුපකාර සමිති පනත (1972 අංක 5)
5	සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	සමාගම් පනත (2007 අංක 7)/ ව්‍යාපාර නාම පනත (1987 අංක 7)/ සීට්ටු ආඥාපනත(1935 අංක 3)/ පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අරමුදල්

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටු කරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන හා අරමුදල් පහත පරිදි වේ.

අනු අංකය	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු	ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්
1	සීමාසහිත ලංකා සතොස සමාගම	සමාගම් පනත (2007 අංක 7)
2	සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව	සමුපකාර තොග වෙළෙඳ සංස්ථා පනත (1949 අංක 44)
3	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය	අනුකූලතා ඇගයීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත (2005 අංක 32)/ වෙළෙඳ සලකුණු පනත 1964 අංක 3)
4	ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල	මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66)
5	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	පාරිභෝගික කටයුතු අධිකාරී පනත (2003 අංක 9)
6	සමුපකාර සේවක කොමිෂන් සභාව	සමුපකාර සේවක කොමිෂන් සභා පනත (1972 අංක 12)
7	ජාතික සමුපකාර සංවර්ධන ආයතනය	ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත (2001 අංක 1)
8	ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන	සමාගම් පනත (2007 අංක 7)
9	ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය	බුද්ධිමය දේපළ පනත (2003 අංක 36)
10	සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව	සමාගම් පනත (2007 අංක 7)
11	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම	සමාගම් පනත (2007 අංක 7)

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

නොමැත

2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2025.01.01 දින සිට 2025.12.31 දක්වා ප්‍රගතිය

ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර

• සියලුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ඒකාබද්ධ කරමින් එම ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම හා මෙහෙය වීම සඳහා 2025.10.09 වන දින " National Agri Market Services Limited" නමින් භාණ්ඩාගාර ලේකම්වරයාට පූර්ණ කොටස් අයිතිය ඇති රාජ්‍ය සමාගමක් ස්ථාපිත කර ඇත.

ගොවීන්ට තම නිශ්පාදන භාණ්ඩ වෙළෙඳපොළට සම්බන්ධ කිරීමට හැකිවන පරිදි තිරසාර වෙළෙඳපොළ ජාලයක් ඇති කිරීම තුළින් ගොවීන්ගේ හා පාරිභෝගිකයන්ගේ සුබසාධනය වැඩි දියුණු කිරීම මෙම සමාගමේ ප්‍රධාන අරමුණක් වේ.

• 2025.09.01 දින වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම.

ගොවීන්ට සමෘද්ධිමත් ගොවි ජීවිතයක්, වෙළඳපොළට පුනරුදයක්' යන තේමාව යටතේ වවුනියාව මඩවුවයිත්තකුලම් හි දී වවුනියාව විශේෂ ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

• 2025.09.30 දින යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම.

• කෘෂි නිශ්පාදන සමුපකාර සමිති ශක්තිමත් කිරීම සඳහා මූලික අදියර ලෙස සමුපකාර ව්‍යාපාරය තුළ සක්‍රියව නියමු කාර්යභාරයක් සිදුකළ කෘෂි නිශ්පාදන සමුපකාර සමිති හා විවිධ සේවා සමුපකාර සමිති 10ක් සඳහා ට්‍රැක්ටර් 07ක් සහ ධාන්‍ය වියලන යන්ත්‍ර 03ක් ලබා දී ඇත. ඒ අනුව, නිශ්පාදන සමුපකාර සමිති 1000ක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂයට වෙන් කර

ඇති අයවැය ප්‍රතිපාදන මිලියන 100 න් 2025.12.31 දින වන විට 60% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

• ලංකා සතොස සිය නව ජාලය යටතේ විශාලතම සිල්ලර අලෙවිසැල් සංකීර්ණය 2025 සැප්තැම්බර් 29 වන දින වන බදුල්ලේදී විවෘත කරන ලදී. "ලංකා සතොස එක්ස්ක්ලූසිව් - බදුල්ල" ලෙස නම් කර ඇති මෙම සුපිරි වෙළඳසැල සඳහා නිමි ඇඳුම්, අවන්හල්, බේකරි නිශ්පාදන යනාදී මෙතෙක් සතොස අලෙවිසැල් ජාලය තුළ නොතිබූ අංශද ඇතුළත් කර ඇත.

• ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව වෙත ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

අර්තාපල් අස්වනු සාධාරණ මිලකට ලංකා සතොස ආයතනය හා පෞද්ගලික අංශය මඟින් මිලදී ගෙන පාරිභෝගිකයාට සාධාරණ මිලකට අලෙවි කිරීමට මඟපෙන්වීම හා සම්බන්ධීකරණය.

• අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව පාරිභෝගික ජනතාව වෙත සැපයීම අරමුණු කර ගනිමින් අදාළ ආයතන සම්බන්ධීකරණය කිරීම හා වෙළෙඳපොලේ හිඟයක් ඇතිවන බව නිරීක්ෂණය වන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය (සහල්, අල, ළූණු වැනි) ප්‍රමාණවත් සැපයුම සහතික කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ආහාර සුරක්ෂිතතා කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

• අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී නියාමන කටයුතු පාරිභෝගික අධිකාරිය සමඟ සම්බන්ධීකරණය කිරීම මගින් පාරිභෝගික ජනතාවට අවශ්‍ය සහන ලබා දීමට මඟපෙන්වීම.

• දේශීය ළූණු හා අල ගොවීන් සුරක්ෂිත කිරීමට අල හා ළූණු සඳහා ආනයන බදු පැනවීමට අවශ්‍ය කටයුතු සඳහා සෘජුව සම්බන්ධ වීම.

• වසර 30 පසු රට තුළ ඇති වූ දේශගුණික විපර්යාසය හේතුවෙන් ලුණු කර්මාන්තයේ ඇති වූ නිෂ්පාදන හිඟතාවය වළක්වා ගැනීම සඳහා වෙළෙඳපොළ ස්ථාවර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

වෙළෙඳ හා වාණිජ

• 2025 ඔක්තෝම්බර් මාසයේදී ජිනීවාහි පැවැත් වූ WTO වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනයට ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම් සහ අදාළ නිලධාරීන් සහභාගී වූ අතර, එහිදී ගෝලීය සහයෝගය ඇතිව ශ්‍රී ලංකාව WTO වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය අවසන් කරන ලදී.

• ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන යෙදීම 2025 වර්ෂයේ සිට ආරම්භ කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

• ආහාර සැකසුම්, කෘෂිකර්මාන්තය සහ ඒ ආශ්‍රිත අංශවල හවුල්කාරිත්වයන්, ආයෝජන අවස්ථා සහ තාක්ෂණ හුවමාරු ගවේෂණය කිරීමට වේදිකාවක් ලබා දුන් 2025 ලෝක ආහාර උත්සවය සැප්තැම්බර් මාසයේදී ඉන්දියාවේ දී පැවැත්විණි. ඒ සඳහා ගරු අමාත්‍යතුමා සහ අමාත්‍යාංශයේ ලේකම් සහභාගී වූ අතර එහිදී කෘෂි ව්‍යාපාර සහ ආහාර සමාගම්වල ප්‍රධානීන් හමුවූ අතර, කර්මාන්ත සංගම්වල නියෝජිතයින් සමඟ සාකච්ඡා ද පැවැත්විණි. "ආහාර සුරක්ෂිතතාව, සමුපකාර සංවර්ධනය සහ ධාරිතා වර්ධනය යන ක්ෂේත්‍රවල ද්විපාර්ශ්වික සහයෝගීතාව ශක්තිමත් කිරීම සහ අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන අනෙකුත් අංශ හරහා සහයෝගීතාව වැඩි දියුණු කිරීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු විය.

• Regional Comprehensive Economic Partnership (RCEP) සම්බන්ධයෙන් වන මූලික සාකච්ඡා පවත්වා ඇති අතර මූලික ප්‍රශ්නාවලිය හා Leagal Gap Analysis RCEP (Support Seretariet) කාර්යාලය වෙත භාර දී ඇත.

• ජාතික තීරුබදු ප්‍රතිපත්තිය (National Tariff Policy) ක්‍රියාත්මක කිරීමට අදාළව උප කමිටු රැස් කර එක් එක් ක්ෂේත්‍ර සඳහා වන බදු සංශෝධනයන් සාකච්ඡා කිරීම.

ශ්‍රී ලංකාවේ ජාතික තීරු බදු ප්‍රතිපත්තියේ විධිවිධාන වලට අනුකූලව තීරු බදු වෙනස් කිරීම හෝ යාවත්කාලීන කිරීම, නිර්දේශ කිරීම ඇතුළුව ජාතික තීරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස කෘෂිකර්ම, වැවිලි කර්මාන්ත, ධීවර, කර්මාන්ත යන අංශයන් ආවරණය වන පරිදි වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අනු කමිටුවක් පිහිටුවීම හා සාකච්ඡා කිරීම.

ඍතුමය වශයෙන් නිශ්පාදනය කෙරෙන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනයේදී බදු පැනවීම සිදු කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මත පනවන ආනයනික බදු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.

- යෝජිත ශ්‍රී ලංකාව හා නවසීලන්තය අතර වන වෙළෙඳ හා ආයෝජන රාමු ගිවිසුම් (Trade and Investment Framework Agreements) සම්බන්ධයෙන් වන සාකච්ඡා හා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

- ලෝක බැංකුව හා මුදල්, ක්‍රමසම්පාදනය සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති නව තීරු බදු සංශෝධන පිළිබඳ සාකච්ඡා සිදු කෙරිණි.

- දැනට ක්‍රියාත්මකව පවතින නිදහස් වෙළෙඳ ගිවිසුම් සමාලෝචනය කිරීමට සහ ඉදිරි කාල සීමාව තුළ එකඟතා ඇති කර ගැනීම පිණිස නිර්දේශ ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව විසින් මේ වන විට ක්‍රියාත්මකව පවතින නිදහස් වෙළෙඳ ගිවිසුම් සමාලෝචනය කිරීමට සහ ඉදිරි කාල සීමාව තුළ එකඟතා ඇති කර ගැනීම පිණිස නිර්දේශ ලබා දීමට අදාළ වාර්තාවක් සකස් කරමින් පවතී.

- 2025 දෙසැම්බර් 09 වන දින ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර 03 වන වෙළඳ උප කමිටු රැස්වීම (Sub-Committee Meeting on Trade) කොළඹදී පැවැත්වුණු අතර, දෙරටේම ඉහළ පෙළේ නියෝජිතයින් එක්රැස් කරමින් ද්විපාර්ශ්වික වෙළඳාම, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කරන ලදී.

- දකුණු ආසියානු කාන්තා ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ඩිජිටල් සහ මාර්ගගත ව්‍යාපාරික කුසලතා ශක්තිමත් කර ගැනීමට උපකාර කිරීම අරමුණු කරගත් තෙදින වැඩමුළුවක් 2025 නොවැම්බර් 18-20 දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්විණි.

• 2025.10.15 වන දින ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) සහ වරණීය මෙන්ම වරණීය නොවන වෙළඳ විධිවිධාන හරහා ලබා ගත හැකි වෙළඳපල ප්‍රවේශ අවස්ථා පිළිබඳව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින්, වාණිජ දෙපාර්තමේන්තුව, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය (SED) සමඟ එක්ව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SMEs) සඳහා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් ගාල්ල දිස්ත්‍රික්කයේදී සාර්ථකව පවත්වන ලදී.

• 2025.06.19 වන දින කුන්මින් දියැන්චි ජාත්‍යන්තර සම්මේලන සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ පැවති එක්ස්පෝ හි ශ්‍රී ලංකා මණ්ඩපය නිල වශයෙන් විවෘත කරන ලද්දේ ගරු වසන්ත සමරසිංහ සහ අරුන් හේමචන්ද්‍ර යන අමාත්‍යවරුන් විසිනි. මෙම ප්‍රදර්ශනය සඳහා රටවල් සහ කලාප 54 කින් ප්‍රදර්ශකයින් 1,400 කට වැඩි පිරිසක් සහභාගී විය. මෙම මණ්ඩපය ශ්‍රී ලංකාවේ තේ, කුළුබඩු, මැණික් හා ස්වර්ණාභරණ, හස්ත කර්මාන්ත, ඇඟලුම්, පොල් ආශ්‍රිත නිෂ්පාදන, බතික් සහ සංචාරක ව්‍යාපාරය වැනි ප්‍රධාන අංශ ප්‍රදර්ශනය කළ අතර, ජාත්‍යන්තර ගැනුම්කරුවන්ට සහ අමුත්තන්ට ශ්‍රී ලංකාවේ අද්විතීය ආර්ථික හා සංස්කෘතික ශක්තිය පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙන ලදී.

• චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ වෙළඳ හා ආර්ථික කොමිසමේ 8 වන රැස්වීම 2025 මැයි මස 29 වන දින කොළඹදී පැවැත්විණි. චීන වාණිජ අමාත්‍ය වැන්ග් වෙන්ටාඕ සහ ශ්‍රී ලංකා වෙළඳ අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ යන මහත්වරු සම-මූලිකත්වය දැරූ අතර, එහිදී දෙපාර්ශ්වයම "එක් තීරයක් සහ මාවතක්" සහයෝගීතාව ඉදිරියට ගෙන යාම, වෙළඳාම සහ ආයෝජන පුළුල් කිරීම සහ බහුපාර්ශ්වික වෙළඳ පද්ධතිය ආරක්ෂා කිරීම පිළිබඳ ගැඹුරු අදහස් හුවමාරු කර ගත්හ. සාකච්ඡාවලින් පසුව අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදී. එක් ගිවිසුමක් වෙළඳ පහසුකම් සැපයීමේ තාක්ෂණික කමිටුව (Working Group) ස්ථාපිත කිරීම සහ අනෙක කාර්මික සහ සැපයුම්දාම සහයෝගීතාව (industrial and supply chain cooperation) පිළිබඳව විය.

ප්‍රධාන ඒකාබද්ධ කොමිසමට සමගාමීව ශ්‍රී ලංකා - චීන වෙළඳ හා ආයෝජන සංසදය (Sri Lanka – China Trade and Investment Forum) 2025 මැයි මස 30 වන දින පැවැත්විණි. ඒ සඳහා, ප්‍රමුඛ පෙළේ චීන ව්‍යවසායන් 77 ක ජ්‍යෙෂ්ඨ නියෝජිතයින් 115 කට අධික පිරිසක් සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ප්‍රධාන සාමාජිකයින් එක්රැස් විය. මෙම ඉහළ මට්ටමේ උත්සවය ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව, ලංකා වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා - චීන ව්‍යාපාරික කවුන්සිලය සහ යන්ත්‍රෝපකරණ සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන ආනයන හා අපනයනය සඳහා වූ චීන වාණිජ මණ්ඩලය (CCME) විසින් සම සත්කාරකත්වය දරන ලදී.

• මෑත වසරවලදී ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තය ඇමරිකා එක්සත් ජනපදයයි. 2025 දී එක්සත් ජනපදයට අපනයනය කළ මුදල ඇමරිකානු ඩොලර් බිලියන 2.9 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 3% ක වර්ධනයක් පිළිබිඹු කරයි. තත්ත්වයන් මෙසේ පවතිද්දී, එක්සත් ජනපදය විසින් එක් එක් රටවල් සමඟ ඔවුන්ගේ වෙළෙඳ පරතරයන්/ශේෂයන්හි පරතරය අවම කර ගැනීම උදෙසා අන්‍යෝන්‍ය තීරු බදු ක්‍රමයක් 2025 දී හඳුන්වා දුන් අතර, ඒ අනුව විවිධ රටවල්වලට ඔවුන්ගේ වෙළෙඳ පරතරයන්ගේ ප්‍රමාණය මත අන්‍යෝන්‍ය තීරු බදු පනවන ලදී. එම වැඩ සටහන යටතේ ශ්‍රී ලංකාවටද 44% අන්‍යෝන්‍ය තීරු බද්දක් පනවන ලදී.

පසුව පැවති සාකච්ඡාවට කිහිපයක ප්‍රතිඵලයක් ලෙස 2025 අගෝස්තු මස දී එම 44% ක් වූ අන්‍යෝන්‍ය තීරු බද්ද දී 20% දක්වා එය තවදුරටත් ලිහිල් කරන ලදී. ශ්‍රී ලංකාවට පනවන ලද තීරු බද්ද තවදුරටත් අඩු කර ගැනීම උදෙසා විශේෂ කණ්ඩායමක් ඇමරිකා එක්සත් ජනපදය සමඟ සාකච්ඡා පවත්වමින් සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස කිසියම් ආකාරයට මෙම සාකච්ඡාව අවසානයේ ශ්‍රී ලංකාවට වාසි දායක යෝග්‍ය වූ වෙළෙඳ ගිවිසුමකට ඇතුළත් වීමටද අපේක්ෂා කෙරේ.

• ශ්‍රී ලංකාව - තුර්කියේ ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ඒකාබද්ධ කමිටුවේ (JCETC) 3 වන සැසිවාරය 2025 ජූලි 24 වන දින කොළඹදී පැවැත්විණි. මෙම ඉහළ මට්ටමේ රැස්වීම ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළ අතර, තීරණාත්මක අංශ කිහිපයක් හරහා සහයෝගීතාව පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය.

වෙළඳාම සහ ආයෝජනයේ සිට කෘෂිකර්මය, අධ්‍යාපනය, සමුද්‍රීය කටයුතු, ප්‍රවාහනය, සෞඛ්‍ය, සංචාරක සහ තාක්ෂණය සහ නවෝත්පාදනය දක්වා පුළුල් පරාසයක සහයෝගීතාව පුළුල් කිරීම සඳහා දෙරටේ නව කැපවීම මෙම රැස්වීමේදී අවධාරණය කෙරිණි.

ශ්‍රී ලංකා දූත පිරිසට නායකත්වය දුන්නේ වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ මහතා වන අතර, තුර්කි දූත පිරිසට එහි ජාතික අධ්‍යාපන අමාත්‍ය යූසුෆ් ටෙකින් මහතා නායකත්වය දුන්නේය. වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ලේකම් සහ ජාත්‍යන්තර ගිවිසුම් සහ යුරෝපා සංගම් කටයුතු පිළිබඳ තුර්කියේ අධ්‍යක්ෂ ජනරාල් තාක්ෂණික මට්ටමේ සාකච්ඡාවලට නායකත්වය දුන්හ.

ආයතනික සම්බන්ධීකරණ කටයුතු

අමාත්‍යාංශයේ සියලු ආයතනික කටයුතු සිදුකිරීම මෙන්ම අනෙකුත් ආයතන සම්බන්ධීකරණය සිදුකිරීම, අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම කර ඇත.

අනු අංකය	අමාත්‍ය මණ්ඩල තීරණ දිනය	අමාත්‍ය මණ්ඩල සංදේශ මාතෘකාව
1	2025/01/06	රතු කැකුළු සහල් ආනයනය සඳහා අනුමැතිය
2	2025/01/20	ගෘහස්ථ සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ (විවිධ) නීතිගත සංස්ථාව විසින් පිරිසැකසුම් හා අයඩීනීකරණය නොකළ ලුණු මෙට්‍රික් ටොන් 30,000 ක් ආනයනය කිරීම
3	2025/01/20	අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) යටතේ සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් නාඩු සහල්වලට සමාන සහල් මෙට්‍රික් ටොන් 20,800 ආනයනය කිරීම.
4	2025/01/20	සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරේ වැඩ බැලීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී, කේ.ඒ.පී.ද සිල්වා මහත්මිය පත් කිරීම.
5	2025/01/20	මන්නාරම් දිස්ත්‍රික්කයේ තාරපුරම් සමුපකාර ගම්මාන ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු තීරණය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම
6	2025/02/03	මැඩ්රිඩ් ප්‍රොටොකෝලය යටතේ වෙළෙඳ හා සේවා ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම.
7	2025/02/03	ජාතික සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ රේඛීය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම.
8	2025/02/09	ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ලේඛන ඩිජිටල්කරණය කිරීම
9	2025/02/09	ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම
10	2025/02/19	වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම, වාණිජ දෙපාර්තමේන්තුව
11	2025/03/10	අමාත්‍ය මණ්ඩල තීරණය විෂය අංක (32) 25/විවිධ(007) අංක SC/FR/288/2023 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම
12	2025/03/03	වෙළෙඳ ප්‍රතිකර්ම නියෝග ක්‍රියාත්මක කිරීම සහ වාණිජ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ප්‍රතිකර්ම ඒකකය ශක්තිමත් කිරීම
13	2025/05/15	ගෘහස්ථ සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් පිරිසැකසුම් හා අයඩීනීකරණය නොකළ ලුණු මෙට්‍රික් ටොන් 8,400 ක් ආනයනය කිරීම
14	2025/03/10	අංක SC/FR/99/2024 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම
15	2025/03/24	“කාලීන ආහාර පැකේජය” ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදය
16	2025/03/24	2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම
17	2025/03/24	සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව යළි සක්‍රීය කිරීම

අනු අංකය	අමාත්‍ය මණ්ඩල තීරණ දිනය	අමාත්‍ය මණ්ඩල සංදේශ මාතෘකාව
18	2025/03/24	2019 වසරෙහි දක්ෂිණ සංවර්ධන වැඩසටහනේ මාර්ග සංවර්ධන කටයුතු සුදුසු අමාත්‍යාංශයක් වෙත පැවරීම.
19	2025/03/24	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරී, ලාල් හේවාපතිරණ මහතා රාජකාරී ඉටු කිරීමේ පදනමින් ආහාර කොමසාරිස් තනතුර සඳහා පත් කිරීම
20	2025/04/01	ජාතික සමුපකාර සංවර්ධන ආයතනය- වාර්ෂික වාර්තාව 2023
21	2025/04/07	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 05
22	2025/04/21	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 06
23	2025/05/07	සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරන ලද කේ.ඒ.පී.ද සිල්වා මහත්මිය පුහුණු වැඩසටහනක් සඳහා විදේශගතවීම හේතුවෙන් එම තනතුරේ රාජකාරී ආවරණය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් පී.වී.එස්.හර්ෂණී මහත්මිය පත් කිරීම.
24	2025/05/07	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 07
25	2025/05/19	වාණිජ අධ්‍යක්ෂ ජනරාල් පත්කිරීම - වාණිජ දෙපාර්තමේන්තුව
26	2025/05/15	ගෘහස්ථ සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා අයඩීනීකරණ නොකළ අමු ලුණු (කුඩු කළ සහ කැට ලුණු) ආනයනය කිරීම
27	2025/05/19	විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම පිණිස සීමිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීම සඳහා අනුමැතිය
28	2025/05/26	පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා නියෝග ඉදිරිපත් කිරීම (2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත)
29	2025/05/26	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 08
30	2025/05/26	ශ්‍රී ලංකාව සහ චීනය අතර සුමට ද්විපාර්ශවික වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අනුමැතිය
31	2025/05/26	විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම පිණිස වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම සඳහා අනුමැතිය
32	2025/06/02	ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 1 ශ්‍රේණියේ නිලධාරිනී, හිමාලි හෙට්ටිහෙලගේ මහත්මිය වැඩබලන පදනම මත බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත් කිරීම
33	2025/06/09	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ලෝක වෙළෙඳ සංවිධානයේ ධීවර සහනාධාර පිළිබඳ ගිවිසුමේ පළමු අදියර අපරානුමත කිරීම සඳහා අනුමැතිය
34	2025/06/02	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 09
35	2025/06/02	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - වාර්ෂික වාර්තාව 2022
36	2025/06/02	සී/ස ලංකා සතොස සමාගම - වාර්ෂික වාර්තාව 2022

අනු අංකය	අමාත්‍ය මණ්ඩල තීරණ දිනය	අමාත්‍ය මණ්ඩල සංදේශ මාතෘකාව
37	2025/06/09	සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් රාජ්‍ය ආයතන විසින් තනි මිල කැඳවුමක් මත භාණ්ඩ හා සේවා මිලදී ගැනීම
38	2025/06/16	සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් රාජ්‍ය ආයතන විසින් තනි මිල කැඳවුමක් මත භාණ්ඩ හා සේවා මිලදී ගැනීම
39	2025/06/23	සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව - වාර්ෂික වාර්තාව 2023/2024
40	2025/07/01	ජාතික තත්ත්ව සහාව ස්ථාපිත කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ මෙහෙයුම් කමිටුවක් හා තාක්ෂණ ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම
41	2025/07/01	වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා පත් කරන ලද අමිනා ෂාහි මොහින් මහත්මිය නැම්බියාවේ පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය වෙළෙඳ අමාත්‍යවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ වෙළෙඳ නිලධාරී රැස්වීම සඳහා විදේශගතවීම හේතුවෙන් එම තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා වැඩ බලන වාණිජ අධ්‍යක්ෂ පී. ජයකොඩි මහතා පත් කිරීම.
42	2025/07/07	රාජකාරී ඉටු කිරීමේ පදනමින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ආහාර කොමසාරිස් තනතුර සඳහා පත් කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරී ලාල් හේවාපතිරණ මහතාගේ ධුර කාලය දීර්ඝ කිරීම
43	2025/07/07	බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා රාජකාරී ආවරණය කිරීමට වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජී.එල්.ඩී. දහනායක මහත්මිය පත් කිරීම.
44	2025/07/21	2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම
45	2025/07/21	ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ හිටපු බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් ගීතාංජලී ආර්. රණවක මහත්මිය සේවයෙන් විශ්‍රාම ගැනීම
46	2025/06/23	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 10
47	2025/07/24	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සටහන ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 11
48	2025/08/04	සමුපකාර සංවර්ධන කොමසාරිස්/ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, තරණී කුමාරදාස මහත්මිය පත් කිරීම.
49	2025/07/21	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සටහන ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 12
50	2025/07/21	කර්මාන්ත අවශ්‍යතා වෙනුවෙන් සහල් හෝ කැඩුණු සහල් සහ වෙනත් විකල්ප අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා නිර්දේශ ලබා දීම පිණිස වන තාක්ෂණික කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම
51	2025/08/04	කර්මාන්ත අවශ්‍යතා වෙනුවෙන් සහල් හෝ කැඩුණු සහල් සහ වෙනත් විකල්ප අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා නිර්දේශ ලබා දීම පිණිස වන තාක්ෂණික කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම
52	2025/08/11	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සටහන ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 13

අනු අංකය	අමාත්‍ය මණ්ඩල තීරණ දිනය	අමාත්‍ය මණ්ඩල සංදේශ මාතෘකාව
53	2025/08/25	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර ගැනීම.
54	2025/08/25	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 14
55	2025/09/03	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව විසින් වියලි කහ මෙට්‍රික් ටොන් 1,000ක් ආනයනය කිරීම
56	2025/09/03	සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට (සතොස) බඳවා ගන්න ලද සේවකයන් ගේ සේවය දීර්ඝ කිරීම සහ සේවක සංඛ්‍යාව බඳවා ගැනීම
57	2025/09/08	සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ (සතොස) බඳවා ගන්නා ලද සේවකයින්ගේ සේවය දීර්ඝ කිරීම සහ සේවක සංඛ්‍යාව බඳවා ගැනීම
58	2025/09/08	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 15
59	2025/09/03	සමාගම් රේගිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීම
60	2025/09/22	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සටහන ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 16
61	2025/09/22	සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට (සතොස) ස්ථිර හා කොන්ත්‍රාත් සේවකයන් බඳවා ගැනීම
62	2025/10/07	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - වාර්ෂික වාර්තාව 2023
63	2025/10/07	සහල් ආනයනය/ ප්‍රසම්පාදනය සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම
64	2025/10/07	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සටහන ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 17
65	2025/10/07	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය 2025/26 මහා කන්නය සඳහා කුඹුරු ඉඩම් වල වගා කරන ගොවීන්ට පොහොර සඳහා මූල්‍ය සහනාධාර ලබා දීම
66	2025/10/13	ඒකාබද්ධ අමාත්‍යමණ්ඩල සංදේශය වෙළෙඳපොළ හිඟයක් ඇතිවන බව නිරීක්ෂණය වන සහල් වර්ගයන්හි ප්‍රමාණවත් සැපයුම සහතික කිරීම
67	2025/10/13	තෝරාගත් කෘෂිකාර්මික භාණ්ඩ සී/ස ලංකා සතොස සමාගම විසින් සෘජුවම මිලදී ගැනීම
68	2025/10/13	සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 50,000 ක් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා ආනයනය සහ සැපයීම
69	2025/10/13	සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ (සතොස) විස්තීරණ ව්‍යාපාරික සැලැස්ම ක්‍රියාත්මක කිරීම
70	2025/10/21	බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ රාජකාරී ආවරණය කිරීමට වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී, කුමුදු මීගහගේ මහතා පත් කිරීම

අනු අංකය	අමාත්‍ය මණ්ඩල තීරණ දිනය	අමාත්‍ය මණ්ඩල සංදේශ මාතෘකාව
71	2025/10/21	මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආර්.ජී.එස්.ඒ.පෙරේරා මහතා එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය සඳහා පත් කිරීම
72	2025/10/21	රාජ්‍ය ආයතන විසින් සීමා සහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ(විවිධ) නීතිගත සංස්ථාවෙන් තනි මිල කැඳවුමක් මගින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය
73	2025/10/27	සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ (සතොස) විස්තීරණ ව්‍යාපාරික සැළැස්ම ක්‍රියාත්මක කිරීම
74	2025/1/03	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සටහන ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 18
75	2025/11/10	සමුපකාර සංවර්ධන කොමසාරිස්/ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තනතුර සඳහා වෙළෙඳ,වාණිජ,ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනි, තරණි කුමාරදාස මහත්මිය පත් කිරීම
76	2025/11/17	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීම
77	2025/11/24	කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කරිත්ව (RCEP) ගිවිසුමට ශ්‍රී ලංකාව ඇතුලත් වීම සඳහා අනුමැතිය
78	2025/12/01	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව රැස්වීම් අංක 19
79	2025/12/01	විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සංවර්ධනය හා කළමනාකරණය සඳහා අලුතින් සංස්ථාගත කරන ලද "නැෂනල් ඇග්‍රී මාර්කට් සර්විසස් ලිමිටඩ්" වෙත ආරම්භක ප්‍රාග්ධනය වෙන් කිරීම
80	2025/12/10	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 20
81	2025/12/10	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 21
82	2025/12/10	විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සංවර්ධනය හා කලනමකරණය සඳහා අලුතින් සංස්ථා ගත කරනු ලද "නැෂනල් ඇග්‍රී මාර්කට් සර්විසස් ලිමිටඩ්" වෙත ආරම්භක ප්‍රාග්ධනය වෙන් කිරීම
83	2025/12/10	ප්‍රධානය කිරීම් අවලංගු කිරීම: සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 50,000 ක් සීමා සහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා ආනයනය කර සැපයීම
84	2025/12/15	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 21
85	2025/12/15	සමුපකාර සංවර්ධන කොමසාරිස්/ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තනතුරේ රාජකාරී ආවරණය සඳහා වෙළෙඳ,වාණිජ,ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ඉනෝෂා අසන්ති පෙරේරා මහත්මිය පත් කිරීම
86	2025/12/15	මන්නාරම දිස්ත්‍රික්කයේ තාරපුරම් සමුපකාර ගම්මාන ව්‍යාපෘතියේ අනාගත ක්‍රියාකාරකම් පිලිබඳ තීරණය කිරීම පිණිස කමිටුවක් පත් කිරීම සම්බන්ධයෙන් වාර්තාව ඉදිරිපත් කිරීම
87	2025/12/15	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය වෛද්‍ය සැපයුම් අංශය සඳහා ගබඩා පහසුකම් ලබා ගැනීම - වේයන්ගොඩ උප ගබඩාව

අනු අංකය	අමාත්‍ය මණ්ඩල තීරණ දිනය	අමාත්‍ය මණ්ඩල සංදේශ මාතෘකාව
88	2025/12/15	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය වී අලෙවි මණ්ඩලය සතුව දැනට මිලදී ගෙන ඇති වී තොග සතොස ආයතනය මඟින් සහල් කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය ලියාපදිංචි වී මෝල් හිමියන් වෙත අවස්ථාව ලබා දීම.
89	2025/12/15	ප්‍රධානය කිරීම් අවලංගු කිරීම: සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 50,000 ක් සීමා සහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා ආනයනය කර සැපයීම
90	2025/12/22	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 20
91	2025/12/22	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව - රැස්වීම් අංක 22
92	2025/12/22	සීමා සහිත ලංකා සතොස හි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීම
93	2025/12/22	ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වභාර අරමුදල වාර්ෂික වාර්තාව - 2023
94	2025/12/22	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - වාර්ෂික වාර්තාව 2024
95	2025/12/29	මන්නාරම් දිස්ත්‍රික්ක යේ තාරපුරම් සමුපකාර ගම්මාන ව්‍යාපෘතියේ අනාගත ක්‍රියාකාරකම් පිළිබඳ තීරණය කිරීම පිණිස කමිටුවක් පත් කිරීම සම්බන්ධයෙන් වාර්තාව ඉදිරිපත් කිරීම
96	2025/12/29	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය ආහාර ප්‍රතිපත්ති හා සිරක්ෂිතතා කමිටුව රැස්වීම් අංක 23

අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි පවතින පුරප්පාඩු පිරවීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කමිටුව වෙතින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ලංකා සතොස ලිමිටඩ්, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව, ලලිත් ඇතුළත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යන ආයතනයන්හි පවතින සේවක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති අතර, මේ වනවිට බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

"ශ්‍රී ලංකාවේ ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සියලු රාජ්‍ය ආයතනවල වගකීම හා කාර්යභාරය" මැයෙන් වූ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛන අංක: 01/2024 ට අනුව 2025 මුදල් වර්ෂයේ දී රාජ්‍ය අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කර ගැනීම සඳහා ව්‍යාපෘති ඇගයීම සඳහා යෝජනා කැඳවනු ලැබීය.

ජාතික ඇගයුම් ප්‍රතිපත්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී 2025 වර්ෂය සඳහා අප අමාත්‍යාංශය යටතේ පවතින ආහාර දෙපාර්තමේන්තුව යටතේ පවතින කෘෂි නිෂ්පාදන ගබඩා කිරීම සඳහා උෂ්ණත්ව පාලනය කළ හැකි මෙ.ටො. 5000 ක ධාරිතාවයෙන් යුත් දඹුල්ල පිහිටි ගබඩාව ඇගයුම්

කටයුතු සඳහා තෝරාගෙන ඇති අතර මෙම කාර්යය ඉටුකිරීමට ස්වාධීන ඇගයුමක් සිදුකිරීම සඳහා අවශ්‍ය උපදේශක ආයතනයක් තෝරා ගැනීමට අයත් ප්‍රසම්පාදන කාර්යයන් සිදුකරමින් පවතින අතර අදාළ මූලාශ්‍ර කමිටුව (Reference Group) හා කළමනාකරණ කමිටුව (Management Group) හඳුනාගෙන ඇත. මේ සඳහා දළ වශයෙන් රු. මි. 2.5ක ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති අතර මෙම ව්‍යාපෘතිය 2026 වසරේදී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

2.2 විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි සැලසුම්

ජයග්‍රහණ

- පෝෂණය සඳහා බහු ආංශික ක්‍රියාකාරී සැළැස්ම (MSAPN)

පෝෂණය සඳහා බහු ආංශික ක්‍රියාකාරී සැළැස්ම (MSAPN) සඳහා වන ප්‍රථම නියමු වැඩසටහන (Pilot Program) සැප්තැම්බර් මස රත්නපුර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරනු ලැබූ අතර එයට සමගාමීව දෙවන වැඩසටහන නොවැම්බර් මස මඩකලපුව දිස්ත්‍රික්කයේ දී පැවැත් වූ අතර, ඉදිරියේදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ද මෙම නියමු වැඩසටහන පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
මඩකලපුව දිස්ත්‍රික්කයේ බහු ආංශික පෝෂණ සැළැස්ම ක්‍රියාත්මක කිරීමේ සමාරාම්භය 2025 නොවැම්බර් 7 වන දිනයේ පැවැත්විය. එම සමාරාම්භය SUN කේන්ද්‍රගත ශ්‍රී ලංකා නියෝජිතවරිය වන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ ද මඩකලපුව අතිරේක දිසා ලේකම්ගේ ද සහභාගීත්වයෙන් පැවැත්වුණි. සැළැස්ම සන්නසක් මාර්ගයෙන් SUN කේන්ද්‍රගත නියෝජිතතුමිය විසින් අතිරේක දිසාලේකම් වෙත භාර කරන ලදි. මින් පසු කෙටි පුහුණු වැඩසටහනක් ද මේ හා සම්බන්ධව පැවැත්වුණි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ බහුආංශික පෝෂණ සැළැස්ම ක්‍රියාත්මක කිරීමේ සමාරාම්භය 2026 පෙබරවාරි 23 වන දිනයේ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

- ජාතික තත්ත්ව කවුන්සිලය ස්ථාපිත කිරීම සඳහා මෙහෙයුම් කමිටු හා තාක්ෂණික කමිටු පිහිටුවා එහි වැඩ කටයුතු අරම්භ කිරීම.

- සමූපකාර තොග වෙළඳ සංස්ථාව නැවත පිහිටුවීමට අදාළව අමාත්‍ය මණ්ඩලය අනුමැතියන් ලබා ගැනීම.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව නැවත සක්‍රියව ක්‍රියාත්මක කිරීමට සුදුසු, ශක්‍යතාවයෙන් යුත් ව්‍යාපාරික සැළැස්මක් මත පදනම්ව එම අවස්ථාවේ ව්‍යාපාරික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අනුමැතීන් ලබාගැනීමට කටයුතු කිරීම.

• "ජාතික කෘෂි අලෙවි සේවා සමාගම" (National Agri Market Services limited) ස්ථාපිත කිරීම.
දැනට රටපුරා ව්‍යාප්තව පවතින විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන 18 කාර්යක්ෂම හා ඵලදායීව මෙහෙයවීම හා කළමනාකරණය කිරීම සඳහා එක් ව්‍යාපාරික ආකෘතියක් යටතේ ක්‍රියාත්මක කිරීමට "ජාතික කෘෂි අලෙවි සේවා සමාගම" (National Agri Market Services limited) නමින් රාජ්‍ය සමාගමක් ස්ථාපිත කිරීම සිදුකරන ලදී.

මෙම සමාගම පිහිටුවීම තුළින් ගොවීන්ට, වෙළෙඳුන්ට හා පාරිභෝගිකයන්ට වෙළෙඳපොල පුළුල් කිරීමටත් අලෙවි හා මිලදීගැනීමේ පහසුකම් ව්‍යාප්ත කිරීමටත් අපේක්ෂිතය.

• වවුනියා සහ යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන මෙහෙයුම් කටයුතු සිදුකිරීම ආරම්භ කිරීමට කටයුතු කිරීම.

• වර්තමානයේ සමුපකාර ව්‍යාපාරය මුහුණදෙන අභියෝග සහ ගැටළු පිළිබඳව සලකා බලා සමුපකාර ව්‍යාපාරය ප්‍රතිසංස්කරණ කිරීම පිළිබඳව නිර්දේශ ලබා ගැනීම සඳහා විවිධ ක්ෂේත්‍ර වල ප්‍රවීණයන්ගෙන් සහ සමුපකාර ව්‍යාපාරයේ නායකයන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කිරීම.

• භූගෝලීය දර්ශක අදාළ නීති රෙගුලාසි අනුව ලියාපදිංචි කිරීම 2025 වර්ෂය සිට ආරම්භ කර ඇත.

• ආහාර සුරක්ෂිතතාවය සඳහා ගුණාත්මක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒකාබද්ධව BESPA (Based Best Practices of Agri - Food Sector Development) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

• ඇමරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර අන්‍යෝන්‍ය තීරුබදු පහසුකම් ලබාගැනීම සඳහා සම්බන්ධීකරණය හා සාකච්ඡා පැවැත්වීම.

වෙළෙඳ හිඟය අඩු කිරීම සහ තීරුබදු සහ තීරුබදු නොවන බාධක අඩු කිරීම සඳහා එක්සත් ජනපද රජය සමඟ කටයුතු කිරීමට ශ්‍රී ලංකා රජය දක්වන කඩිනම් සහ ධනාත්මක කැපවීම ශ්‍රී ලංකා නියෝජිත පිරිස විසින් අවධාරණය කළහ.

එක්සත් ජනපද රජය ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන සියලුම භාණ්ඩ සඳහා 2025 අප්‍රේල් මාසයේදී 44%ක අන්‍යෝන්‍ය තීරුබද්දක් යෝජනා කළේය. ශ්‍රී ලංකා රජය විසින් ඇමෙරික එක්සත් ජනපද රජය සමඟ කරන ලද අඛණ්ඩ සාකච්ඡා වල ප්‍රතිපලයක් ලෙස, 2025 ජූලි මාසයේදී, ඇමරිකානු ආනයන තීරු බදු 30% දක්වා අඩු කරන ලද අතර, පසුව 2025 අගෝස්තු මාසයේදී 20% දක්වා එය තවදුරටත් ලිහිල් කරන ලදී. . ශ්‍රී ලංකාවට පනවන ලද තීරු බද්ද තවදුරටත් අඩු කර ගැනීම උදෙසා විශේෂ කණ්ඩායමක් ඇමරිකා එක්සත් ජනපදය සමඟ සාකච්ඡා පවත්වමින් සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස කිසියම් ආකාරයට මෙම සාකච්ඡාව අවසානයේ ශ්‍රී ලංකාවට වාසි දායක යෝග්‍ය වූ වෙළෙඳ ගිවිසුමකට ඇතුලත් වීමටද අපේක්ෂා කෙරේ.

අභියෝග

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් වෙළඳ හා ආර්ථික අංශයේ අභියෝග

දිට්වා සුළි කුණාටුව සැපයුම්දාම, ප්‍රවාහන යටිතල පහසුකම් සහ කෘෂිකාර්මික නිශ්පාදනයට හානි කරමින් ශ්‍රී ලංකාවේ වෙළඳ හා ආර්ථික කටයුතු වලට දැඩි ලෙස බලපෑම් එල්ල කරන ලදී. සුළි කුණාටුව හේතුවෙන් ප්‍රධාන වගා සමයේදී විශාල වශයෙන් බෝග වලට හානි සිදු වීම, ආහාර අනාරක්ෂිත භාවයට සහ හිඟයකට තුඩු දුන් අතර, බලපෑමට ලක් වූ ප්‍රදේශවල එළවළු මිල 100%–350% කින් ඉහළ යාමට ද හේතු විය. ලංකා සතොස සමාගම සහ සමුපකාර අංශය, විශේෂයෙන් රට පුරා දැඩි ලෙස බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල, අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීමේදී ප්‍රධාන සැපයුම් අභියෝගවලට මුහුණ දුන්නේය. මාර්ග පද්ධතියට විශේෂයෙන් මධ්‍යම කඳුකරය සහ කොළඹ අතර සම්බන්ධතාවලට විශාල හානියක් සිදුවූ අතර සැපයුම් සහ බෙදා හැරීමේ බාධක තවදුරටත් වර්ධනය විය.

ඉදිරි සැලසුම්

i. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින කුලී පදනම මත වෙනත් ගොඩනැගිලි වල ස්ථාපිත කර ඇති ආයතන ඇතුළු සියලුම ආයතන එකම වහලක් යටතේ ස්ථාපිත කර, එම එක් එක් ආයතන තුළින් පාරිභෝගික ජනතාවට ලබාගත හැකි සේවාවන් ප්‍රමාදයකින් තොරව ලබාගැනීමට අමාත්‍යාංශය විසින් ඍජු අධීක්ෂණය හා සම්බන්ධීකරණය පහසුවීම සඳහාත් සමූපකාර චතුරශ්‍ර ගොඩනැගිල්ල නව මුහුණුවරක් යටතේ බිලියන 07 පමණ වියදමක් දරා 2026 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට යෝජිතය.

ii. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ කිරීම පිණිස පිහිට වූ “ජාතික කෘෂි අලෙවි සේවා සමාගම” (National Agri Market Services limited) නෛතික රාමුව අනුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන මෙහෙයුම් කටයුතු 2026 වසරේ සිට නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

iii. වෙළෙඳ ගිවිසුම් මඟින් පහසුකම් සැළසීමට අවශ්‍ය ප්‍රතිපත්ති රාමුවක් (තරගකාරීත්ව ප්‍රතිපත්ති රාමුව, Competition Policy Framework) සංවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ නිශ්පාදන සඳහා වෙළෙඳපොල ප්‍රවේශය පුළුල් කිරීමට කටයුතු කිරීම සහ තරඟකාරී නීතිමය රාමුවක් (Formulation of Competition Legal Framework) සකස් කිරීම.

iv. ජාතික තත්ත්ව කවුන්සිලය (National Quality Council) පිහිටුවීම.

v. සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධිය සහ ප්‍රගමනය සඳහා දැනට පවතින සමුපකාර පනත සහ සමුපකාර කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට කටයුතු කිරීම. තවද මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සමුපකාර සමිති නියාමනය සඳහා සමුපකාර මූල්‍ය නියාමන පනත 2026 වර්ෂයේ හඳුන්වා දීමට කටයුතු කිරීම.

vi. සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කැපවීම් සපුරාලීම සහ ව්‍යාපාර කිරීමේ පහසුව (ease of doing business) වැඩිදියුණු කිරීම සඳහා eRoC 2 සංවර්ධනය කිරීම.

vii. ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම තිරසාර සංවර්ධනය, නවීකරණය සහ විවිධාංගීකරණය කෙරෙහි අවධානය යොමුකිරීමට අපේක්ෂිතය. ලෝක ආහාර වැඩසටහන සමඟ උපායමාර්ගික සහයෝගීතාවය, රාජ්‍ය සහයෝගය සහ අභ්‍යන්තර ධාරිතා සංවර්ධනය තුළින් ශ්‍රී ලංකාවේ පෝෂණ සුරක්ෂිතතාවය සහතික කිරීම සහ විවිධ ජන කණ්ඩායම් වල සෞඛ්‍ය වැඩිදියුණු කිරීමට සමාගම අපේක්ෂා කෙරේ.

viii. දඹුල්ලේ උෂ්ණත්වය පාලනය කරන ලද ගබඩාවේ තිරසාරභාවය සහතික කිරීම සඳහා සූර්ය පැනල පද්ධතියක් ස්ථාපනය කිරීම.

ix. නිෂ්පාදන සමුපකාර සමිති සඳහා ධාන්‍ය වියලන යන්ත්‍ර ලබා දීම මඟින් පසු අස්වනු හානිය අවම කර ගැනීමට කටයුතු කිරීම.

x. සමුපකාර සමිති වල කාර්යක්ෂමතාව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම සමුපකාර සමිති සඳහා ඵලදායීතා කාර්ය සාධන තරඟාවලියක් 2026 වර්ෂය තුලදී පැවැත්වීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.

xi. 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පද්ධති සංවර්ධන සහ නියාමන විධිවිධානයක් මඟින් ප්‍රතිලාභී හිමිකාරීත්ව ප්‍රකාශනය ක්‍රියාත්මක කරනු ලැබේ.

xii. වෙළෙඳ ගිවිසුම් මඟින් පහසුකම් සැලසීමට අවශ්‍ය ප්‍රතිපත්ති රාමුවක් සංවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ නිශ්පාදන සඳහා වෙළෙඳපොල ප්‍රවේශය පුළුල් කිරීමට කටයුතු කිරීම.

xiii. පාරිභෝගික සුභසාධනය, සාධාරණ හා සදාචාරාත්මක වෙළෙඳාම ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරී පනත සංශෝධනය කිරීම.

xiv. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම.

කේ. ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

3 පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තතය 2025 රු.	- 2024 රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		966,042,000	366,922,144.00	ඒසීඒ-3
-	තැන්පතු		14,048,529	50,633,393.42	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		26,576,294	12,806,578.83	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,006,666,824**	**430,362,116**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,006,666,824**	**430,362,116**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		**585,329,515**	**22,336**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**421,337,309**	**430,339,781**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				

206,300,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	170,086,449	199,815,322.26	
282,100,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	214,689,390	181,975,419.83	**ඒසීඒ-2(ii)**
729,600,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	722,005,718	626,139,248.85	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
1,218,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,106,781,558**	**1,007,929,991**	
	මූලධන වියදම්				
25,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	6,569,126	3,252,406	
8,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	9,726,314	79,650	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	2,452,232	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,000,000	හැකියා වර්ධනය	**14**	975,660	971,566	
100,000,000	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
135,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**17,271,100**	**6,755,854**	
	තැන්පතු ගෙවීම්		36,268,897	50,322,988	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		27,332,300	21,802,543	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**63,601,196**	**72,125,531**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**1,187,653,854**	1,086,811,377	
1,353,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(766,316,545)	**(656,471,596)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(766,371,891)	(656,856,063)	**ඒසීඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		55,346	384,467	**ඒසීඒ-3**
			(766,316,545)	**(656,471,596)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

		තත්‍ය	
	සටහන	**2025**	**2024**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	623,887,321	619,360,426
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	24,756,231	24,000,226
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	55,346	384,467
මුළු වත්කම්		**648,698,898**	**643,745,119**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		11,796,250	(11,180,123)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		623,887,321	619,360,426
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	12,959,981	35,180,348
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	55,346	384,467
මුළු වගකීම්		**648,698,898**	**643,745,119**

පිටු අංක 08 සිට 32 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 33 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.



2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 26/02/2026	දිනය :	දිනය : 2026. 02. 26

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

තෙලුකා එම් පටබැඳිගේ
ප්‍රධාන ගණකාධිකාරී
වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
නො: 492, ආර්. ඒ. ද මැල් මාවත,

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	42,947,117	86,022,570
අග්‍රිම ලැබීම්	966,042,000	366,922,144
වාණිජ දෙපාර්තමේන්තුව විසින් මාරු කරන ලද අතුරු අත්තිකාරම්	-	905,383
නොපියවූ අත්තිකාරම් පියවීම	384,467	160,560
අත්තිකාරම් අයකර ගැනීම්	35,992,262	12,013,240
තැන්පතු ලැබීම්	14,048,529	50,633,393
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,059,414,376**	**516,657,290**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	377,351,035	379,007,049
සහනාධාර සහ මාරුකිරීම්	333,198	69,747,228
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	7,544,786	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	827,864	936,350
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	585,713,982	22,336
අත්තිකාරම් ගෙවීම්	46,366,024	11,933,251
තැන්පතු ගෙවීම්	36,268,897	50,322,988
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,054,405,786**	**511,969,202**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**5,008,590**	**4,688,088**

<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	4,953,244	4,303,622
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,953,244**	**4,303,622**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(4,953,244)**	**(4,303,622)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**55,346**	**384,467**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	55,346	**384,467**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	55,346	**384,467**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>පිළියෙල කිරීමේ අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් එකතු කිරීම අදාළ නොවේ.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම් (රු. මිලියන)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු. මිලියන)	අවසාන ප්‍රතිපාදන (රු. මිලියන)		
පුනරාවර්තන	1218	1215.2	1106.78	91.07%
ප්‍රාග්ධන	135	137.8	17.27	12.53%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

නැත

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.මිලියන

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025දින ට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදි ගිණුම්ක රණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	341.45	-	-
9152	යන්ත්‍රෝපකරණ-අරමුදල	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ-ශීර්ෂය	-	282.43	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TAC/F/MT/2025/FS/69	ඔබේ අංකය / உமது இல. / Your No.	දිනය / திகதி / Date 2026 මැයි 29 දින

ලේකම්,

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය 116 - වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 116 - වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය (සංශෝධිත) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම

ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2025 දෙසැම්බර් 31 දිනට පෙර අයිතිය අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබූ එකතු වටිනාකම රු.160,625,000 ක් වූ වාහන 9 ක් වත්කම් ලේඛනයේ (CIGAS) ඇතුළත් කර හා මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2024 වර්ෂයේදී ලංකා සතොස ආයතනයට පවරා දී තිබූ එකතු වටිනාකම රු. 25,500,000 ක් වූ වාහන දෙකක් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වත්කම් ලේඛනයෙන් (CIGAS) ඉවත්කිරීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය නොවන වත්කම් යටතේද තවදුරටත් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු. 217,018,775කට තක්සේරු කර තිබූ පිළියන්දල, ඇඹිලිපිටිය, කන්දහන්දිය හා කුරුඳුවත්ත යන ආර්ථික මධ්‍යස්ථාන 04 හි ගොඩනැගිලි, එම තක්සේරු වාර්තා අනුව ගිණුම්ගත කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී තිබියදී, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් CIGAS වත්කම් ලේඛනයේ මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වමින් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ජාතික ශිෂ්‍යභට බලකායට ලබාදුන් රු. 505,100 ක් වටිනා වත්කම් අයිතම 37 ක් හා වටිනාකම් හඳුනා නොගත් වත්කම් අයිතම් 4ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් CIGAS හි වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොතිබීමෙන් එම වත්කම් වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ තවදුරටත් පැවතුණි.

(ඉ) 2023 වර්ෂය තුළ බාහිර රාජ්‍ය ආයතන 10 කට අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබූ රු.1,193,790 ක් වටිනා භාණ්ඩ අයිතම් 99 ක් හා වටිනාකම් හඳුනා නොගත් භාණ්ඩ අයිතම් 50 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් CIGAS වත්කම් ලේඛනය තුලින් හා මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබීමෙන් එම වත්කම් වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ තවදුරටත් පැවතුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව, වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරය ද, ලියාපදිංචි කිරීමේ අංකයද, තමන්ට භාර දුන් දිනයද, පැවරු දිනය හා ඒ පිළිබඳ විස්තරද වෙනත් නිසි තොරතුරු ද දැක්වෙන ලේඛනයක් පවත්වාගත යුතු වුවද එවැනි වාහන ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයේ කළමනාකරණ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.2.1 (අ) (i)	අමාත්‍යාංශයට පවරාගෙන ඇති වාහන නිවැරදි වටිනාකමට ගිණුම්ගත කිරීම.	1.6.1 (අ)
1.2.1 (අ) (ii)	අමාත්‍යාංශයට අයත් නොවන වාහන නොපමාව වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීම.	1.6.1 (ආ)
1.2.1 (අ) (iii)	අමාත්‍යාංශයට අයත් සහ අයත් නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම හෝ ඉවත් කිරීම.	1.6.1 (ඉ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක්දුරට නිවැරදිව හා සම්පූර්ණයෙන් පිළියෙළ කළ යුතු වුවද පහත සඳහන් අවස්ථාවල ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය තුල මූලධන වැය විෂයයන් 03 ක් සඳහා ලබා දී තිබූ එකතුව රු. 111,500,000 ක් වූ හා පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා ලබා දී තිබූ එකතුව රු. 1,900,000 ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 15 ක් සඳහා සලසා තිබූ එකතුව රු. 63,650,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 41,280,330 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 සිට සියයට 99 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1.4 ඡේදයෙහි සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.3 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ)	1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත මඟින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි 10 (1) හා (2) වගන්ති සහ 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනතෙහි 16(1) වගන්තිය, සහ "විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල පරිපාලනය සඳහා වන කාර්ය සංග්‍රහය" සම්බන්ධයෙන් වූ අංක DMS/0029/V-III දරන 2017 නොවැම්බර් 01 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය	දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ සේවකයින් 12 දෙනෙකු හා වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවානියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායකත්වය ගෙවා නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 22.4 ඡේදය	සියලුම වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර 96 වැනි පොදු ආකෘතියේ ලියා විගණකාධිපති වෙත මාස්පතා වාර්තා කළ යුතු වුවද, 2022, 2023, 2024 හා 2025 වර්ෂවල වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) හා 757(1)

සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පෙර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් රථ වාහන ලේඛන සමඟ සසඳා බලමින් සෑම වාහනයක්ම භෞතිකව පරීක්ෂා කර බැලිය යුතු වුවත්, 2026 මාර්තු 31 වන විටත් සමාලෝචිත වර්ෂය සඳහා වාහන සමීක්ෂණය සිදු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 1645 හා 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 5.1 ඡේදය

සෑම වාහනයක් සඳහාම ලබාගන්නා ඉන්ධන පිළිබඳ විස්තර එදිනම් අදාළ දෛනික ධාවන සටහනට නිසි පරිදි ඇතුළත් කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් වාහන 24 කට සමාලෝචිත වර්ෂය තුල ලබාගෙන තිබූ රු.1,306,827ක් වටිනා ඉන්ධන ලීටර් 4,521ක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 1647(ආ)

වාහනයක සිදු කරනු ලබන සියලුම අලුත්වැඩියාවන් ලොග් සටහන් පොත්වල ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වසර තුල වාහන 11ක් සම්බන්ධයෙන් සිදු කර තිබූ රු. 3,234,213 ක් වූ අලුත්වැඩියා 31 කට අදාළ තොරතුරු ලොග් සටහන් පොත්වල සටහන් කර නොතිබුණි.

(ඈ) 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

(i) 02 වගන්තිය

සියළුම රාජ්‍ය සේවකයන් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළයුතු වුවද, ආර්ථික මධ්‍යස්ථානවල රාජකාරී සඳහා අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් 18 දෙනෙක් එලෙස පැමිණීම හා පිටවීම සනාථ කර නොතිබූ අතර, 2025 වර්ෂයට අදාළව රු.11,228,247ක් එම නිලධාරීන්ට වැටුප් ලෙස අමාත්‍යාංශයෙන් ගෙවා තිබුණි.

(ii) 03 වගන්තිය

සේවා ස්ථානයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා ඇඟිලි සලකුණු යන්ත්‍ර සෑම

		කාර්යාලයකම ස්ථාපිත කළ යුතු වුවද දඹුල්ල, නුවරඑළිය හා වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානවල ඇඟිලි සලකුණු යන්ත්‍ර 2026 අප්‍රේල් 30 දින වන විටත් ස්ථාපිත කර නොතිබුණි.
(ඉ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සමාලෝචිත වසර තුළ අමාත්‍යාංශයේ සංචිත වාහන 24ක ඉන්ධන පරික්ෂාවන් සිදු කර නොතිබුණි.

3.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ බිම් මහලේ වර්ග අඩි 2,178 ක ස්ථාපිත වෙළඳසැල 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු 22 දක්වා සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ද 2023 අගෝස්තු 23 සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පෞද්ගලික ආයතනයකට ද කුලියට දී තිබුණි. එම වෙළඳසැල අභ්‍යන්තරයේ ස්ථාපිත කරන ලද ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම් 146 ක් (අධි ශීතකරණ, රූපවාහිනී, මුදල් අයකැමි යන්ත්‍ර, රාක්ක, පරිගණක) විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව තෝරාගත් පෞද්ගලික ආයතනයකින් 2021 දෙසැම්බර් 29 දින රු. මිලියන 20 ක් ගෙවා මිලදී ගෙන තිබුණි. එම මිලදී ගත් භාණ්ඩ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව බඩු ලේඛනවල ඇතුළත් කර නොතිබූ අතර 2025 දෙසැම්බර් 31 දින වන විට එම භාණ්ඩවලින් රු. 3,293,800ක් වටිනා අයිතම 13ක් අස්ථාන ගතවී තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් අලාභානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පැවැත්විය යුතු මුදල් රෙගුලාසි 104 ප්‍රකාර පරීක්ෂණ මේ වන තෙක් ආරම්භ කර නොතිබුණි.

(ආ) විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව උක්ත වෙළඳසැල 2023 සැප්තැම්බර් 01 සිට 2025 පෙබරවාරි 28 දක්වා පෞද්ගලික ආයතනයකට මසකට රු.250,000 බැගින් කුලියට දීමට ගිවිසුම්ගත වී තිබුණද, එම භූමි ප්‍රමාණය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් මාසිකව රු.326,700 ක් බැගින් වූ කුලියක් ගොඩනැගිලි හිමිකරුට ගෙවා තිබුණි. ඒ අනුව 2023 සැප්තැම්බර් සිට 2025 පෙබරවාරි මාසය අවසානය දක්වා රු.1,830,600 ක අලාභයක් අමාත්‍යාංශයට සිදු වී තිබුණි. මෙම අලාභය සඳහා වගකිවයුතු පාර්ශව හඳුනාගැනීමට පරීක්ෂණ සිදුකර අලාභය පියවාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ආර්ථික මධ්‍යස්ථානවල රාජකාරි සඳහා අනුයුක්ත කර සිටි සංවර්ධන නිලධාරීන් 18 දෙනෙක් එම අමාත්‍යාංශයේ විෂය පථය වෙනස් වීමත් සමඟ මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017 නොවැම්බර් 01 දිනැති අංක DMS/0029/V-III දරන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පරිපාලනය සඳහා වන කාර්ය සංග්‍රහය ප්‍රකාරව ඔවුන් ආර්ථික මධ්‍යස්ථානවලට විධිමත්ව පත්කළ යුතු වුවද එසේ පත්කර නොතිබූ අතර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් එම නිලධාරින් සඳහා විධිමත් ස්ථාන මාරු නියෝගද මෙතෙක් නිකුත්

කර නොතිබුණි. 2006 ජනවාරි 04 දිනැති අමප/05/2119/027/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ කළමනාකරණ භාර ඔප්පු අනුව, ආර්ථික මධ්‍යස්ථානවල සේවකයන් සඳහා වැටුප් අදාළ මධ්‍යස්ථානවල අරමුදලින් දැරිය යුතු වුවද එම නිලධාරීන්ට 2025 වර්ෂයේදී රු.11,228,247 ක වැටුප් අමාත්‍යාංශයෙන් ගෙවා තිබූ අතර එම මුදල් ආර්ථික මධ්‍යස්ථාන වෙතින් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සියළුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් තම ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වේ. එසේ වුවද අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, වාණිජ දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතනවල 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා මාස 01 සිට මාස 10 දක්වා ප්‍රමාද වී අනුමැතිය ලබාදී තිබුණි. තවද, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය මෙම වාර්තාවේ දින වන විටත් ලබාදී නොතිබුණි.

(ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ සංයුක්ත පාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 2.3 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ ව්‍යවස්ථාපිත අරමුණු ලඟාකරගැනීමට අදාළ සැලසුම් ඇතුළත් පස් අවුරුදු කාලයක් සඳහා උපායමාර්ගික සැලැස්ම, රාජ්‍ය ව්‍යවසායයන් විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා භාණ්ඩාගාර ලේකම්වරයාට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අදාළ පරිදි ඉදිරිපත් කළ යුතු වේ. මෙම සැලසුම් සෑම වසරකම ඉදිරි වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතු වුවත්, සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ හා ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා පිළිවෙලින් මාස 03ක් හා මාස 11ක් ප්‍රමාදවී අමාත්‍යාංශයේ අනුමැතිය ලබාදී තිබුණි. තවද, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, සීමාසහිත ලංකා සතොස ආයතනය සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යන ආයතන තුනෙහි සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලසුම් සඳහා, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අනුමැතිය ලබාදී නොතිබුණි.

4.1.2 අරමුණු ඉටුකර නොකිරීම

(අ) අමාත්‍යාංශයේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු සමාලෝචිත වර්ෂයේදී ද ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(i) ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම.

(ii) අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළව දත්ත පද්ධතියක් පවත්වාගෙන යෑම, එම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සහ දත්ත හා බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.

(iii) ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම හා බුද්ධිමය දේපල පද්ධතියක් ස්ථාපිත කිරීම.

(iv) පාරිභෝගිකයා වඩාත් සුරක්ෂිත කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නීති, අණපනත් යාවත්කාලීන හා සංශෝධන කඩිනම් කිරීම.

(ආ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, 2003 අංක 36 දරන ජාතික බුද්ධිමය දේපල පනත හා 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංශෝධනය කර අවසන් වී නොතිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ වැඩසටහන 6 ක් යටතේ වූ ව්‍යාපෘති 20 ක් සඳහා රු. මිලියන 485.93 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, 2025 දෙසැම්බර් 31 දිනට ඒවායේ උපයෝජනය රු. මිලියන 0 සිට රු. මිලියන 59.46 දක්වා එනම්, මූල්‍ය ප්‍රගතිය සියයට 0 සිට සියයට 58 දක්වා විය.

(ආ) අමාත්‍යාංශය යටතේ ඇති පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ලලිත් ඇතුලත්මුදලි මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල, සීමාසහිත ලංකා සතොස සමාගම, ජාතික සමූපකාර සංවර්ධන ආයතනය හා සමූපකාර තොග වෙළඳ සංස්ථාව යන ආයතන 5 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කර තිබූ ප්‍රාග්ධන ප්‍රතිපාදනවල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය 2026 මාර්තු 16 දින වන විටත් අමාත්‍යාංශය වෙත ලබාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට හා වාණිජ දෙපාර්තමේන්තුවට පිළිවෙලින් රු.මිලියන 100 හා රු. මිලියන 25 බැගින් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 2ක් අනුමත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපයෝජනය පිළිවෙලින් රු.මිලියන 54.69 හා රු.මිලියන 17 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 55 ක් හා සියයට 68 ක් විය. තවද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට රු.මිලියන 100 බැගින් ව්‍යාපෘති දෙකක් සඳහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඉන් එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබූ අතර අනෙක් ව්‍යාපෘතිය සඳහා උපයෝජනය රු.මිලියන 14.3 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 14 ක් පමණක් විය.

(ඈ) ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් හෝ කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතිවල ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර නොතිබුණි.

4.1.4 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයන්හි වාර්ෂික වාර්තා මුදල් වර්ෂය අවසාන වී මාස 05 ක් තුල පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 04 ක 2023 වර්ෂයේ වාර්ෂික වාර්තා සහ ආයතන 10 ක 2024 වර්ෂයේ වාර්ෂික වාර්තා 2026 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණු අතර ආයතන 07 ක 2023 වර්ෂයේ වාර්ෂික වාර්තා මාස 01 සිට අවු 1 ½ කට වැඩි කාලයක් ප්‍රමාදවී සභාගත කර තිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) 2021 සැප්තැම්බර් 28 දිනැති අමප/21/1543/313/053 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් වෙනත් අමාත්‍යාංශ හා ආයතනවලට අයත් දැනට අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන මෙම අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණද 2026 ජනවාරි 16 දින වන විට අමාත්‍යාංශය පරිහරණය කරන වාහන 16 ක් පවරාගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය සතු යතුරුපැදි දෙකක් සඳහා සමාලෝචිත වසර තුළ රක්ෂණය සහ නඩත්තු වියදම් සඳහා රු. 160,242ක මුදලක් වැය කර තිබුණද සමාලෝචිත වසර තුළ එම යතුරුපැදි රාජකාරි කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ ප්‍රතිපාදන නොතිබියදීත් ඉන් එක් යතුරු පැදියක් රියදුරෙකුට වෙන් කර දී තිබුණි.

4.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කරන ලද පහත සඳහන් විගණන විමසුම් 03 සඳහා අමාත්‍යාංශය විසින් පිළිතුරු ලබා දී නොතිබුණි.

	විමසුම් අංකය	විෂයගත කරුණු	නිකුත් කළ දිනය
(අ)	TAC/F/MT/2025/AQ/02	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොකිරීම	2026 මාර්තු 06
(ආ)	TAC/F/MT/2025/AQ/03	අමාත්‍යාංශයේ සැලසුම් පිළියෙල කිරීම, අනුමත කර ගැනීම හා එහි ප්‍රගතිය පරීක්ෂාව- 2025	2026 මාර්තු 31
(ඇ)	TAC/F/DEC/24/PA/31/AQ/04	විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල පරිපාලනමය කටයුතු හා එයට සම්බන්ධවන පාර්ශවයන් සම්බන්ධ පරීක්ෂාව- 2025	2026 අප්‍රේල් 27

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) 2024 නොවැම්බර් 25 වන දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සියලු විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන අමාත්‍යාංශය යටතට පවරා ඇති අතර නුවරඑළිය, කැප්පෙටිපොල, දඹුල්ල, මීගොඩ, වැලිසර, වේයන්ගොඩ, නාරාහේන්පිට, රත්මලාන සහ පිළියන්දල යන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල පරිපාලනය සඳහා 2006 ජනවාරි 04 දිනැති අංක අමප/05/2119/027/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කළමනාකරණ භාරය බැගින් පිහිටුවා ඇති අතර ඒවා පවත්වාගෙන යාමේ නීතිමය ලියවිල්ල, භාර ඔප්පුව වේ. විගණිත දින වූ 2025 සැප්තැම්බර් 30 දිනට එම භාර ඔප්පුවල කාලය අවුරුදු 8 සිට අවුරුදු 22 ක පරාසයක් ගෙන තිබුණද අවස්ථානුකූලව ඒවා යාවත්කාලීන කර නොතිබුණි.

(ii) ආර්ථික මධ්‍යස්ථාන පිහිටි භූමිවල අයිතිය විවිධ දෙපාර්තමේන්තු සහ සමූපකාර සමිති සතුව පැවතුණ ද ඒවා අමාත්‍යාංශයට පවරා ගැනීමට හෝ පවරා ගැනීමේ හැකියාව සොයා බැලීමට කටයුතු කර නොතිබුණි.

(iii) ගබඩා කුලී ආදායම් ඉපයූ නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයේ ගබඩා 12 න් ගබඩා 09 ක් දීමනා පත්‍රයක් මගින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දී තිබූ අතර 2022 අප්‍රේල් 01 දිනට ඉන් ගබඩා 4 කින් අය කර ගත යුතු රු. 22,491,575 ක හිඟ ගබඩා කුලී 2025 සැප්තැම්බර් 30 දින විටත් අය කර ගෙන නොතිබුණි.

(iv) 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත අනුව ව්‍යාපාර පරිශ්‍ර රජයේ දේපළක් වන අතර බදු ගිවිසුම් හා බදු ලිපි අනුව එම පරිශ්‍ර බදුකරුවන් විසින් අතුරු බදුදීම හෝ විකිණීම, පැවරීම, අන්සතු කිරීම නොකළ යුතු වුවද විගණිත දිනට දඹුල්ල හැර අනෙක් ආර්ථික මධ්‍යස්ථාන 08 හි ව්‍යාපාර පරිශ්‍ර 183 ක් අතුරු බදු දී තිබූ අතර නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාර පරිශ්‍ර 58 ක් මුල් බදුකරුවන් විසින් විකිණීම සිදුකර තිබුණි.

(v) විගණනයට ලක් කළ ආර්ථික මධ්‍යස්ථානවල මුළු ව්‍යාපාර පරිශ්‍ර සංඛ්‍යාව 1053 ක් වූ අතර ඉන් පරිශ්‍ර 623 ක් කළමනාකරණ භාර විසින් බදු ගිවිසුම් රහිතව බදු දී තිබුණි. 2025 සැප්තැම්බර් 30 දින වන විට ඉන් 241 ක බදු ගිවිසුම් කාලය අවසන් වී තිබුණි.

(vi) විගණිත දින වූ 2025 සැප්තැම්බර් 30 දිනට විගණනයට ලක් කළ ආර්ථික මධ්‍යස්ථාන 07 ක ව්‍යාපාර පරිශ්‍ර කුලී හා දඩ කුලී එකතුව රු. 76,504,103 ක් හිඟව පැවති අතර ඉන් රු.29,516,391 ක් වසර 4 කට වැඩි විය. තවද නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයේ ගබඩා 03 කින් ගබඩා කුලී රු. 86,509,280 ක් අයවිය යුතුව පැවති අතර ඉන් රු.43,125,780 ක් වසර 04 ට වැඩි විය.

(vii) දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට අදාළ 2017 ජනවාරි 24 දිනැති කළමනාකරණ භාර ඔප්පුවේ 7(අ) ඡේදය ප්‍රකාරව ස්ථාපනකරුගේ අනුමැතියකින් තොරව හිඟ මුදල් කපා හැරිය නොහැකි වුවද, 2025 ජනවාරි 31 දින පැවති කළමනාකරණ භාර රැස්වීමේදී

ගෙන තිබූ තීරණ අනුව ඉකුත් වර්ෂවල සිට ලැබිය යුතුව පැවති කඩ කුලි හා දඩ මුදල් පිළිවෙළින් රු. 1,860,385 ක් හා රු. 9,717,723 ක් ලෙස එකතුව රු 11,578,108 ක් ගිණුම්වලින් කපා හැර තිබුණි.

(viii) දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ බදු කුලී ගිවිසුම් විවිධාකාරයෙන් ලබා දීමත්, 2019 වර්ෂය වන විට බොහෝ බදු ගිවිසුම්වල බදු කාලසීමාව අවසන් වී තිබීමත් හේතුවෙන් ව්‍යාපාර පරිශ්‍ර බදු හිමියන් 149 ක් විසින් තක්සේරු බදු කුලියට වඩා අඩු කුලියක් කළමනාකරණ භාරයට ගෙවා තිබුණි. ඒ අනුව එම ව්‍යාපාර පරිශ්‍රවලින් මසකට රු. 2,426,151 ක් බැගින් එක් වසරකට රු.29,113,812 ක කුලී ආදායමක් කළමනාකරණ භාරයට අහිමි වී තිබුණි.

(ix) විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන, කෘෂි නිෂ්පාදන හා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග හා සිල්ලරට අලෙවි කිරීමේ අරමුණින් ස්ථාපිත කර තිබුණද රත්මලාන, නාරාහේන්පිට, මීගොඩ හා වැලිසර ආර්ථික මධ්‍යස්ථාන 04හි කඩ කාමර 114 ක් එම අරමුණට අදාළ නොවන භාණ්ඩ අලෙවියට සහ සේවා සැපයීමට යොදාගෙන තිබුණි.

(x) කාර්යක්ෂම හා තරඟකාරී වෙළඳපොල යාන්ත්‍රීකරණයට අනුබල දෙමින් අතරමැදිකරුවන්ගේ බලපෑම් අවම කරමින් සාධාරණ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම, විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ එක් අරමුණක් වුවද ව්‍යාපාර පරිශ්‍ර 411 ක් හිමිකරුවන් 158 දෙනෙකු අතර බෙදී ගොස් තිබූ අතර එහිදි පරිශ්‍ර 07 ක් එක් හිමිකරුවෙකුටද, පරිශ්‍ර 06 බැගින් 05 දෙනෙකුටද, පරිශ්‍ර 05 බැගින් 10 දෙනෙකුටද, පරිශ්‍ර 04 බැගින් 04 දෙනෙකුටද, පරිශ්‍ර 03 බැගින් 32 දෙනෙකුටද, පරිශ්‍ර 02 බැගින් 106 දෙනෙකුටද වශයෙන් ව්‍යාපාර පරිශ්‍ර බෙදී ගොස් තිබුණි. මේ අනුව තරඟකාරිත්වය සීමාසහිත විම හා ව්‍යාපාරිකයන්ගේ කේවල්කිරීමේ හැකියාව වැඩිවීම සිදු වී තිබුණි.

(xi) "විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල පරිපාලනය සඳහා වන කාර්ය සංග්‍රහය" මැයෙන් අංක DMS/0029/V-III දරන 2017 නොවැම්බර් 01 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ 04 (III) අනුව මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලයේ පත්වීම් බලධාරියා වශයෙන් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කළ යුතු වුවද, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර තනතුරු දෙකක් සඳහා එම ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකරු විසින්ද, මීගොඩ සහ පිළියන්දල ආර්ථික මධ්‍යස්ථානවල කම්කරු තනතුරු දෙක බැගින් තනතුරු හතරක් සඳහා අදාළ එක් එක් කළමනාකරණ භාරයේ ලේකම් විසින්ද පත්වීම් ලබා දී තිබුණි.

(xii) ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර ඔප්පුවල 11 (ආ) හා (ඇ) ඡේද ප්‍රකාරව ගිණුම් කාලපරිච්ඡේදය අවසාන වී මාස 3 ක් ඇතුලත ඉදිරිපත් කළයුතු නාරාහෙන්පිට, මීගොඩ, වේයන්ගොඩ හා පිළියන්දල ආර්ථික මධ්‍යස්ථානවල 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනද මීගොඩ, වේයන්ගොඩ හා පිළියන්දල ආර්ථික මධ්‍යස්ථානවල 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනද පිළියන්දල ආර්ථික මධ්‍යස්ථානයේ 2023 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනද මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(xiii) ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සී/ස රාජ්‍ය වාණිජ (සමුපකාර) තොග වෙළඳ සමාගම (State Trading Co-operative Wholesale Company Ltd) නමැති රාජ්‍ය සමාගමක් අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. එසේ වුවද අමප/21/1313/313/045 හා 2021 අගෝස්තු 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම සමාගම ඈවර කිරීමට අමාත්‍යාංශ ලේකම්ට ලබා දී තිබූ නියෝග 2026 අප්‍රේල් 30 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද යථෝක්ත සමාගම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් සලසා දෙන ලද ඇපකර වෙනුවෙන් මහජන බැංකුව වෙත 2013 මැයි 22 දිනට ගෙවීමට තිබූ හිඟ මුදල වූ රු.31,485,686 පියවීම සම්බන්ධයෙන් විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය සම්බන්ධයෙන් 2024 අගෝස්තු 08 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී (COPA) ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට ලබා දී තිබූ, ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් සර්වර් යන්ත්‍ර මිලදී ගැනීමට ගෙවන ලද රු.මිලියන.32.5 ක් මාස 03 ක් ඇතුලත නැවත අය කර ගැනීම සහ විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතනයන්හි පවත්වාගෙන යන තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගීතා මධ්‍යස්ථානයන් හි ක්‍රියාකාරීත්වය සඳහා සුදුසු යෝජනාවලියක් හා සංකල්ප පත්‍රිකාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම යන නියෝග 2026 අප්‍රේල් 30 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

5 තිරසාර සංවර්ධනය

(අ) අමාත්‍යාංශයෙහි සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධන ඉලක්ක 3 යටතේ වෙළෙඳපොළ තුළ ආහාර හිඟයක් ඇතිවීම වැලැක්වීමේ අරමුණ යටතේ 2025 දෙසැම්බර් 31 දිනට දඹුල්ල ගබඩා සංකීර්ණය ඉදිකිරීමේ හා මෙහෙයුම් ක්‍රියාවලියේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 75 සිට සියයට 100 දක්වා වන බව සඳහන් කර තිබුණි. එළවළු හා පළතුරු ගබඩා කර කල් තබා ගැනීමේ ශීතකරණ ගබඩා සංකීර්ණය ඉදිකිරීම හා මෙහෙයුම් ක්‍රියාවලිය එහි ජයග්‍රහණ දර්ශකය ලෙස දක්වා තිබුණි. එසේ වුවද 2020 වර්ෂයේදී ආරම්භ කර තිබූ අදාළ කාර්යයෙහි ඇස්තමේන්තුගත කාල සීමාව ඉක්මවා වසර 4 ½ ක් ගත වී ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද එහි මෙහෙයුම් ක්‍රියාවලිය 2026 අප්‍රේල් 30 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර ආරක්ෂිත සංචිතයක් පවත්වා ගැනීම යන අරමුණු යටතේ ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, දේශීය වශයෙන් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂිත තොග පවත්වාගෙන යාමට නිසි ක්‍රමවේදයක් ඇති කිරීමට ද කටයුතු කර නොතිබුණි.

6 යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වගන්තිය ප්‍රකාරව, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, සමුපකාර සේවක කොමිෂන් සභාව හා වාණිජ දෙපාර්තමේන්තුව යන ආයතන තුන සඳහා අභ්‍යන්තර විගණකවරුන් පත් කර නොතිබුණි.

එම්. ඩී. සුදර්ශනී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැළැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව	✓		
වෙළෙඳපොළ සමතුලිතතාව	✓		
විදේශ වෙළෙඳ කටයුතු ප්‍රවර්ධනය.	✓		
ජාතික බුද්ධිමය දේපළ ආරක්ෂණය	✓		
උසස් අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය	✓		
සමාගම් හා සමිති ලියාපදිංචි කිරීම	✓		

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50-74	75-100
ඉලක්කය (1) තිරසාර ආර්ථික වර්ධනයක් ඇතිකිරීම තුළින් සහ සහනදායී මිල ක්‍රමයක් තුළින් දරිද්‍රතාව අවම කිරීමේ වැඩසටහන් අධීක්ෂණය කිරීම.	දේශීය නිෂ්පාදකයින් සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම	දේශීය ගොවීන් ආරක්ෂා කිරීම අරමුණු කොට, ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා ආනයනික තීරු බදු සම්බන්ධයෙන් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත අවස්ථානුකූලව නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම තුළින් දේශීය ගොවීන් මෙන්ම පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම. නිෂ්පාදකයන්, වෙළෙඳුන් සහ පාරිභෝගික ජනතාව මුහුණපානු ලබන ප්‍රශ්න හා දුක් ගැනවිලි පිළිබඳ ලැබෙන සියලු නියෝජනයන් අදාළ ආයතන වෙතට යොමු කර ඒවාට විසඳුම් ලබා දීමට කටයුතු කිරීම හා මාර්ගෝපදේශ සැපයීම.			✓ ✓
ඉලක්කය (2) සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම.	උසස් හා වෘත්තීය අධ්‍යාපනය ලබන දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා සඳහා දිරිමත් කිරීම.	උසස් හා වෘත්තීය අධ්‍යාපනය හදාරන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව ලබාදීම හා අනාගත රැකියා වෙළෙඳපොල සඳහා වෘත්තිකයන් බිහි කිරීම.			✓

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50- 74	75- 100
ඉලක්කය (3) ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිත පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම.	වෙළෙඳපොළ තුළ ආහාර හිඟයක් ඇතිවීම වැළැක්වීම.	එළවළු හා පළතුරු ගබඩාකර කල්තබා ගැනීමේ ශීතාගාර ගබඩා සංකීර්ණය ඉදිකිරීම හා මෙහෙයුම් ක්‍රියාවලිය.			✓
	ආහාර ආරක්ෂිත සංචිත පවත්වාගෙන ගැනීම.	පවත්වා ගනු ලබන ආරක්ෂිත සහල් තොග.			✓
ඉලක්කය (4) කුසගින්න නිමා කිරීම, සහ ආරක්ෂිත, පෝෂ්‍යදායි සහ ප්‍රමාණවත් ආහාර සඳහා ප්‍රවේශය සහතික කිරීම.	නවෝත්පාදන, තිරසරභාවය සහ කාර්යක්ෂමතාව තුළින් පෝෂණ නිශ්පාදන සැපයීම සහ ගර්භනී මව්වරුන්, වයස අවුරුදු 3-5 සහ වයස මාස 6 සිට අවුරුදු 3 දක්වා ළමුන් අතර මන්දපෝෂණය තුරන් කිරීම තුළින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා වයසට ගැළපෙන සහ පෝෂණ සමතුලිත නිශ්පාදන ප්‍රවේශය පුළුල් කිරීම. කාර්යක්ෂම සම්පත් භාවිතය තුළින් පෝෂණ මැදිහත්වීම් වල තිරසරභාවය වැඩි දියුණු කිරීම	ඉලක්කගත ප්‍රතිලාභීන්ට ත්‍රිපෝෂ සහ සුපෝෂ ප්‍රශස්ත පෝෂ්‍ය පදාර්ථ සමඟ ලබා දීමෙන් සහ දේශීය ගොවීන්ගෙන් ලබා ගනිමින් ශක්තිමත් කරන ලද අතිරේක ආහාර නිශ්පාදන වෙළෙඳපොළට හඳුන්වා දීමෙන් සෞඛ්‍ය සම්පන්න ජාතියක් සඳහා දායක වීම.		✓	

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50- 74	75- 100
ඉලක්කය (5) වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, එළවළු, පළතුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.	අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය තුළින් වෙළෙඳපොළ භාණ්ඩ සුලබ කිරීම.	ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1 ක ණය පහසුකම යටතේ ආනයනය කරනලද අත්‍යවශ්‍ය භාණ්ඩ.			✓
		අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව පාරිභෝගික ජනතාවට සැපයීම සඳහා රටතුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ඉල්ලුමට සරිලන සැපයුම පවත්වාගෙන යාමට හා මිල ගණන් ඉහළ යාමෙන් ඇතිවන තත්ත්වයන් පාලනය කර පාරිභෝගිකයාට සහන සැලසීම සඳහා විවෘත ගිණුම් යටතේ අත්‍යවශ්‍ය ආහාර වර්ග 10 ක් ආනයනයට ලබාදුන් නිර්දේශ.			✓

5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

1. රට තුළ පැවති ආර්ථික අර්බුදකාරී අවස්ථාවේ වුව ද අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය තුළින් වෙළෙඳපොළ සමතුලිතතාව ඇති කිරීමට හැකි වීම.

2. පාරිභෝගික සේවා අධිකාරියේ මැදිහත්වීම තුළ අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල අස්ථාවර වීම යම්තාක් දුරට පාලනය කළ හැකි වීම.

3. විදේශ වෙළෙඳපොළ අවස්ථා විවර කර ගැනීමට අපනයන කරුවන් දිරිගැන්වීමට හැකි වීම.

අභියෝග

1. පාරිභෝගික සේවා අධිකාරියේ අදාළ සේවාවන් සැපයීමේ දී ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති වීම.

2. මිනුම් ඒකක ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව හා බුද්ධිමය දේපළ කාර්යාලීය කටයුතු ඉටු කිරීමේ දී අවශ්‍ය තාක්ෂණික පහසුකම් අවම වීම.

3. බුද්ධිමය දේපළ කාර්යාලයේ කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම.

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	31	23	8
තෘතියික	5	2	3
ද්විතීයික	139	81	58
ප්‍රාථමික	30	24	6
තාවකාලික	4	3	1
එකතුව	**209**	**133**	**76**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

මෙම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය අතරින් ද්විතියික මට්ටමේ තනතුරු 58ක් පුරප්පාඩුව පවතින අතර ඒ හේතුවෙන් අමාත්‍යාංශයේ දෛනික කාර්යයන් ඉටු කර ගැනීමේදී ද්විතීයික මට්ටමේ පුරප්පාඩු නිසා කාර්ය මණ්ඩලය අපහසුතාවයට පත්වන අවස්ථාවන් උද්ගත වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම්/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Procurement Guidelines, Planning & Regulations - Pending	01	දින 03	18, 000	-	දේශීය	Knowledge of Procurement Guidelines, Planning & Regulations - Pending
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	01	දින 03	6, 500	-	දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳව දැනුම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	02	දින 01	13, 000	-	දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳව දැනුම
New Procurement Guidelines - 2024	04	දින 02	36, 000	-	දේශීය	Knowledge of New Procurement Guidelines
කැබිනට් පත්‍රිකා ලිවීම	01	දින 01	5, 000	-	දේශීය	කැබිනට් පත්‍රිකා ලිවීම පිළිබඳව දැනුම
ව්‍යාපෘති යෝජනා ලිවීම	03	දින 02	31, 500	-	දේශීය	ව්‍යාපෘති යෝජනා ලිවීම පිළිබඳව දැනුම
2024 ප්‍රසම්පාදන ක්‍රමවේදය	61	දින 01	270, 000	-	දේශීය	ප්‍රසම්පාදන ක්‍රමවේදය පිළිබඳව දැනුම
රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති	05	දින 02	50, 000	-	දේශීය	රාජ්‍ය අංශයේ මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය වන ගිනුම්කරණ ප්‍රමිත පිළිබඳව දැනුම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	02	දින 02	36, 000	-	දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳව දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Procurement of IT related Products & Services	04	දින 02	40, 000		දේශීය	Knowledge of Procurement of IT related Products & Services
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පාඨමාලාව	02	දින 02	24, 000		දේශීය	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කිරීම පිළිබඳව දැනුම
Diploma in Public Procurement & Contact Administration	01	අවුරුදු 01	80, 000		දේශීය	Knowledge of Public Procurement & Contact Administration
රජයේ වාහන නඩත්තුව	02	දින 01	13, 000		දේශීය	රජයේ වාහන නඩත්තුව පිළිබඳ දැනුම
මූලික විමර්ශන	01	දින 01	6, 500		දේශීය	මූලික විමර්ශන පිළිබඳව දැනුම
ලිපිගොනුකරණය	01	දින 01	6, 500		දේශීය	ලිපිගොනුකරණය පිළිබඳ දැනුම
කාර්යාල කළමනාකරණය / මුදල් රෙගුලාසි	01	දින 02	12, 000		දේශීය	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම
ප්‍රසම්පාදන සහතික පත්‍ර පාඨමාලාව	01	දින 01	30, 000		දේශීය	සම්පාදනය පිළිබඳ දැනුම
නිවාඩු විෂය කාර්යය හා වගකීම	01	දින 01	6, 500		දේශීය	නිවාඩු විෂය කාර්යය හා වගකීම පිළිබඳ දැනුම
Essentials of ICT and Using of AI for Smart Office	අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්	දින 02	141, 635		දේශීය	Knowledge of Essentials of ICT and Using of AI for Smart Office
Motivation, Worker Satisfaction and Work Life Balance	අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්	දින 01	190, 000	-	දේශීය	Knowledge of Motivation, Worker Satisfaction and Work Life Balance

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	මෙම අමාත්‍යාංශයේ මෙම අත්තිකාරම් ගිණුම් නොපවතී	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.6	**වෙනත්**	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන ගිණුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GA – N20) යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ . 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරි වරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැළැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැළැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ . 134(2) DMA/1-2020 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැළැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ ඇතැම් අංශවලින් පිළිතුරු ලැබීම සඳහා මාසයකට වැඩි කාලයක් ගත වී ඇත.	සිහි කැඳවීම් ලිපි යොමු කිරීම සහ ප්‍රමාදයකින් තොරව පිළිතුරු ලබා දෙන මෙන් අමාත්‍යාංශයේ විගණන හා කලනමකරන කමිටු රැස්වීමේදී සාකච්ඡා කර තීරණය කර ඇත.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2020 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ජේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කම්ප්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.2	වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ජේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම.	අනුකූල නොවේ	අමාත්‍යාංශය සතු වාහන 43ක් සංචිත වාහන 3ත් 2024 වසරේදී ඉන්ධන පරීක්ෂණයට සිදු කර ඇත.	සියලුම වාහන සඳහා මේ වනවිට ඉන්ධන පරීක්ෂාව සිදු කිරීම ආරම්භ කර ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල නොවේ	කල්බදු වාහන නොමැත	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සළසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	පොදු තැම්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	අදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ අදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අතිරික්ත නිලධාරීන් සඳහා අවශ්‍ය තනතුරු අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇත.	
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		සකස් කර ඇත. තවදුරටත් සංවර්ධනය කරමින් පවතී

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	සකස් කර ඇත. තවදුරටත් සංවර්ධනය කරමින් පවතී	
19	මානව සම්පත් සැළැස්ම සම්පාදන කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැළැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		රා.ප.ච.02/2018 (1) අනුව කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැළැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්. ඒ. ද. මැල් මාවත, කොලඹ 03. දුරකථනය: 0112435511 ෆැක්ස් : 0112432255 විද්‍යුත් තැපැල:
info@trademin.gov.lk

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு
இல.492 ஆர்.ஏ.டி.மேல் மாவத்தை, கொழும்பு-03. தொலைபேசி: 0112435511 தொலைநகல்: 0112432255
மின்னஞ்சல்: info@trademin.gov.lk

Ministry of Trade, Commerce, Food Security and Co-operative Development
No 492, R A De Mel Mawatha, Colombo 03. Tel: 0112435511 Fxa: 0112432255 E-mail:
info@trademin.gov.lk